වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

2020



කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

விவசாயப் பட்டப் பின் படிப்பு நிறுவனம்
பேராதனைப் பல்கலைக்கழகம்

POSTGRADUATE INSTITUTE OF AGRICULTURE
UNIVERSITY OF PERADENIYA

වාර්ෂික වාර්තාව - 2020



කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දැක්ම

කෘෂිකර්මාන්තය සහ ඒ හා බැඳුණු ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි සහ පර්යේෂණයන්හි විශිෂ්ට වූ ගෝලීය තරගකාරී මධ්‍යස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

උසස් ගුණාත්මක බවින් යුත් පශ්චාත් උපාධි අධ්‍යාපනය සපයමින් උසස් ඵලදායි සහ නව්‍යතාවයෙන් යුත් ප්‍රමුඛ පර්යේෂණයන් දිරිගන්වමින් කෘෂිකර්මාන්තය සහ ඒ හා බැඳුණු ක්ෂේත්‍රයන්හි ප්‍රවීනතාවයෙන් හෙබි වෘත්තිකයන් බිහි කිරීම

ඉලක්ක

- සියලු පශ්චාත් උපාධි වල ගුණාත්මක භාවය සහ අදාළත්වය පවත්වාගෙන යාම.
- උසස් ගණයේ ගුණාත්මක පර්යේෂණ, නව නිපැයුම් සහ ධාරිතා වර්ධන කටයුතු දිරිගන්වමින් විශිෂ්ට පර්යේෂණ සංස්කෘතියක් කරා මෙහෙයවීම.
- ප්‍රවීණ සහ කැපවීමෙන් ක්‍රියා කරන අධ්‍යයන, පරිපාලන සහ සහයක කාර්ය මණ්ඩලයකින් යුක්ත වීම.
- ශිෂ්‍ය සහ ආයතනික කාර්ය මණ්ඩලය අතර උසස් වෘත්තීමය කුසලතා, ආචාර ධර්ම, යහ පැවැතුම් සහ නායකත්ව ගුණාංග ස්ථාපිත කිරීම.
- දැනුම් තොරතුරු සියලු පාර්ශවකරුවන්වන් වෙත ලබාදීම.
- යහපාලනය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම පරිපාලනයක් සහ තිරසර මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙන යාම.

අධ්‍යක්ෂකතුමාගේ ප්‍රකාශය



කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1979 අංක 9 දරන ප්‍රඥප්තිය යටතේ මෙරට පශ්චාත් උපාධි අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනයක් වශයෙන් ස්ථාපිත කරන ලද අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව කමනාකරණ මණ්ඩලයක මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වනු ලබයි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ රට තුළ පවත්නා ධාරිතාවය වැඩි දියුණු කිරීමත් ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් පුළුල් වන කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අවැසි මනා පුහුණුවක් ලද විද්‍යාත්මක දැනුමෙන් සපිරි පිරිසක් බිහි කිරීමත් ය. දශක හතරකට ආසන්න කාලයක් පුරාවට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම ජාතික මෙහෙවරෙහි නියැළෙන්නේ අංග සම්පූර්ණ උසස් අධ්‍යාපන ආයතනයක් සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ කටයුතු පිළිබඳ මෙරට සහ කලාපීය විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වෙමිනි.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් විද්‍යාපති උපාධි පාඨමාලා (පාඨමාලා වැඩ සහ පාඨමාලා වැඩ නා පර්යේෂණ වශයෙන්) 30ක් ද පර්යේෂණ උපාධි (දර්ශනපති සහ දර්ශනශූරී වශයෙන්) පාඨමාලාවන් ද අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ පිරිනමනු ලබයි . තමන්ටම අනන්‍ය වූ සුවිශේෂී ඉගැන්වීම් සහිත කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ බොහොමයක්ම පාඨමාලා මෙහෙයවනු ලබන්නේ පුළුල් ඉගැන්වීම් සහ පර්යේෂණ අත්දැකීම්වලින් පරිණත විශ්වවිද්‍යාල, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, ජාතික සහ අන්තර්ජාතික ආයතන සහ පෞද්ගලික ආයතනයන්හි අනුයුක්ත බාහිර කථිකාචාර්ය මණ්ඩලයක් මගිනි.කෘෂිකර්ම විද්‍යා පීඨය හරහා අති නවීන තාක්ෂණික උපකරණ සහිත අංග සම්පූර්ණ විද්‍යාගාර පහසුකම් යටතේ ශිෂ්‍යයන්ට අවශ්‍ය ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය ලබාදෙයි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මේ වන විට අවධානය යොමු කර ඇත්තේ අධ්‍යයන දැනුම ලබාදීමට පමණක් සීමා නොවී බොහෝ පර්යේෂණ සිසුන් ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමට ය.

පසුගිය දශක හතරක කාල පරිච්ඡේදය තුළ විවිධ වූ උපාධි අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍ය බඳවා ගැනීමේ සැලකිය යුතු ප්‍රගතියක් ආයතනය හිමිකරගෙන ඇති අතර එය ආරම්භයේ දී සිසුන් 19 ක් වූ නමුත් මේ වන විට වාර්ෂිකව සිසුන් 500 ඉක්මවා ඉහළ ගොස් ඇත. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඉතා පුළුල් විෂය පරාසයක් තුළ 5000කට අධික වූ පශ්චාත් උපාධිධාරීන් මේ දක්වා මෙම ආයතනය විසින් බිහිකර ඇත. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව විවිධ විෂය ධාරා හැදෑරූ උපාධිධාරීන්ගෙන් සමන්විත වෙයි.විවිධ රටවලින් පැමිණි විදේශීය උපාධිධාරීන් මේ වන විට ඔවුන්ගේ පශ්චාත් උපාධි, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දී සම්පූර්ණ කර ඇති අතර තායිලන්තය, මාලදිවයින සහ ඇෆ්ගනිස්ථානය යන රටවලින් පැමිණිය ශිෂ්‍යයෝ වර්තමානයේ දී ඔවුන්ගේ පශ්චාත් උපාධි පාඨමාලා හදාරමින් සිටිති. ඇතැම් උපාධි ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ ව පිරිනමනු ලබයි.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තම නිම්වළලු සමාජයේ පුළුල් පරාසයකට ව්‍යාප්ත කරමින් කොළඹ අග නගරයේ දී ප්‍රදානය කරන ලද පාඨමාලාවන් අති සාර්ථකව පවත්වාගෙන යනු ලබන්නේ ය. 2020 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයට කොවිඩ්19 වසංගතයෙන් දැඩි බලපෑමක් ඇතිවිය. ආයතනය ඉතා කෙටි කාලයක් තුළ දුරස්ථ ඉගැන්වීම් ක්‍රියාදාමයට සූදානම් විය යුතු වුවත්, සැබැවින්ම කොවිඩ් -19 වෙස්වලාගත් ආශිර්වාදයක් ම විය.වර්තමානයේ දී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සියලුම අධ්‍යයන පාඨමාලා මාර්ගත ක්‍රමයට ඉගැන්වීම එය ලද විශිෂ්ට ජයග්‍රහණයක් වන අතර අනාගතයේ දී නූතන තාක්ෂණික යටිතල සංවර්ධන උපාය මාර්ග හඳුන්වාදෙමින් ඉගැන්වීම් කරගෙන යාමට ආයතනය සැලසුම් කර ඇත.

මහාචාර්ය සී එම් බී දෙමටවැව/ අධ්‍යක්ෂක

පටුන

පිටුව

අ	හැඳින්වීම	1
ආ	ජයග්‍රහණ	2
ඇ	බාධක	3
ඈ	අනාගත සැලසුම්	3
ඉ	ජාත්‍යන්තරීකරණය	11
ඊ	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2020 වර්ෂයේදී ඉලක්ක කරගත් තිරසාර වැඩසටහන්	12
කෘෂි පීඨ පුස්තකාලයේ වාර්තාව		13
මූල්‍ය කාර්යය සාධනය		16
ව්‍යවස්ථාපිත වර්තාව සහ වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති පිළිබඳ හෙළිදරව් කිරීම්		20
පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සහ විගණන පිළිතුරු.		51

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය-2020

නිලබලයෙන් පත්වන ලද සාමාජිකයින්

1. මහාචාර්ය සී .එම්. බී .දෙමටවැව මයා, අධ්‍යක්ෂ,කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2. ඩබ්. කේ. එල් .ඊ .වලල්ලාවිට මයා, ප්‍රධාන මුල්‍ය නිලධාරි උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා
3. එම් .ජේ .එම්. ඉල්හාම් නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
4. ආචාර්ය එස් .එච් .එස්.ඒ .ද සිල්වා මයා,අතිරේක ලේකම් මහවැලි කෘෂිකර්මාන්ත වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
5. ලේකම් පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
6. කේ .ඒ .අයි. ඩි .සිල්වා මයා, අධ්‍යක්ෂ,- භූ සම්පත් මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
7. ඩබ් .ඒ .සී..වේරගොඩ මයා - වන සංරක්ෂක ජෙනරාල්
8. ආචාර්ය කේ. ජී .අයි .අමරසිංහ,ලේකම්, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
9. ආචාර්ය ඩබ් .එම් .ඩබ් .වීරකෝන්, අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දේපාර්තමේන්තුව
10. ආචාර්ය ආර්. හෙට්ටිආරච්චි , අධ්‍යක්ෂ ජනරාල් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දේපාර්තමේන්තුව
11. ආචාර්ය ඒ .පී. හීන්කෙන්ද, අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දේපාර්තමේන්තුව
12. ආචාර්ය ඩී .එම් .එස්. මුණසිංහ, පීඨාධිපති පශු වෛද්‍ය සහ සත්ව විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
13. මහාචාර්ය ඩී .කේ .එන්. ජී පුෂ්පකුමාර, පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
14. ආචාර්ය ඒ. එම් .ජේ .බී .අධිකාරි, පීඨාධිපති,කෘෂිකර්ම විද්‍යා පීඨය රජරට විශ්වවිද්‍යාලය
15. ආචාර්ය එම්. පී .එස් .මාගමගේ පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය, සබරගමුව විශ්වවිද්‍යාලය
16. මහාචාර්ය එස් .ඩී වන්නිආරච්චි, පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය රුහුණු විශ්වවිද්‍යාලය
17. ආචාර්ය එම්.පග්තිනාදන් , පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය
18. ආචාර්ය කේ .සුර්යකුමාර්, පීඨාධිපති ,කෘෂිකර්ම පීඨය යාපනය විශ්වවිද්‍යාලය
19. මහාචාර්ය ජේ. සි .එදිරිසිංහ, පීඨාධිපති,කෘෂිකර්ම පීඨය, වයඹ විශ්වවිද්‍යාලය

කෘෂිකර්ම පීඨයෙන් තෝරාපත්කරණ ලද සාමාජිකයින්

20. මහාචාර්ය ඩී .සී .බණ්ඩාර මිය, කෘෂි ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
21. ආචාර්ය එස් .පී .වැලිගමගේ, කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
22. මහාචාර්ය කේ. එස් .පී. අමරතුංග, කෘෂි ඉංජිනේරුවිද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
23. ආචාර්ය එල් .එන් .ඒ. සී. ජයවර්ධන, කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
24. මහාචාර්ය ජී .එල්. එල් .පී .සිල්වා මිය, සත්ව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
25. මහාචාර්ය බී .එම් .එල්. ඩී .බී .සුරියගොඩ, ජීව සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ අධ්‍යන මණ්ඩලය
26. මහාචාර්ය එස්. කොඩිතුවක්කු, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
27. ආචාර්ය ඩබ් .එම් .ටී .පී .ආරියරත්න බෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

28. මහාචාර්ය ඩී. සි .කේ .ඉලේපෙරුම මිය ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
29. මහාචාර්ය ඒ .එම් .ඩී .කොස්තා මිය පැලෑටි ආරක්ෂණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
30. ආචාර්ය ඩබ් .එස් .දන්දෙණිය මිය පාංශු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරණ ලද සාමාජිකයන්

31. විද්‍යා නිධි මහාචාර්ය එච් .පී .එම් .ගුණසේන, බෝග විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
32. ආචාර්ය එන් .ජයසුරිය, ස්වාධින උපදේශක
33. මහාචාර්ය එස් .කේ .පින්නවල, සමාජවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
34. ආචාර්ය එල්. එස් .කේ .හෙට්ටි ආරච්චි ,අධ්‍යක්ෂක,තේ පර්යේෂණ ආයතනය
35. මහාචාර්ය එම් .බී .රණතිලක , ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

වගු

පිටුව

ආ .1	සම්පත් සහ ශිෂයින් පිළිබඳ තොරතුරු	4
ආ .2	පශ්චාත් උපාධි පාඨමාලා හදාරන දේශිය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු	4
ආ .3	උපාධි පාඨමාලාවල නියැලෙන විදේශිය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු	5
ඇ	කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු	6
ඇ .2	2020 වර්ෂයේදී ලද ජාතික හා අන්තර් ජාතික සම්මාන	7
ඇ .3	2020 වර්ෂයේ පොදු ජනතාවට දැනුම සන්නිවේදනය කිරීම පිළිබඳ තොරතුරු	9
ඉ. 1	පවත්වන ලද අන්තර්ජාතික සම්මාන්ත්‍රණ සහ වැඩමුලු	11
ඉ .2	2020 වර්ෂයේ දී උපාධි අපේක්ෂක පාඨමාලා ඉගැන්වීම් පශ්චාත් උපාධි පාඨමාලා ඉගැන්වීම් පරිසංවාද වැඩමුලු සඳහා සහභාගී වූ ජාත්‍යන්තර කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු	12

සංවිධාන ව්‍යුහය



කෙටියෙදුම්:

පේ ස මූ – ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පේ ස පු-ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති
ප වි/වැ –පද්ධති විශ්ලේශක සහ වැඩසටහන්කරු
ස.ලේ – සහකාර ලේකඛාධිකාරී
ස.පු -සහකාර පුස්තතාලාධිපති

***අධ්‍යයන මණ්ඩල**

කෘෂිකර්මජීවවිද්‍යාව
කෘෂිකර්මආර්ථිකවිද්‍යාව
කෘෂිකර්මඉංජිනේරුවිද්‍යාව
කෘෂිකර්මව්‍යාප්තසේවා
සත්වවිද්‍යාව
ව්‍යාපාරපරිපාලනය
ජීවසංඛ්‍යානය
බෝග විද්‍යාව
ආහාරවිද්‍යාවසහ තාක්ෂණය
පැලෑටිආරක්ෂනය
පාංශු විද්‍යාව

වාර්ෂික වාර්තාව - 2020

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
(2020 දෙසැම්බර් 31 දිනට)

(අ) හැදින්වීම

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1972 අංක 01 දරණ පැරණි ලංකා විශ්වවිද්‍යාල පනත යටතේ 1974 අංක 02 දරණ ව්‍යවස්ථාව මගින් 1975 වසරේ ජුනි මාසයේ දී ස්ථාපිත කොට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදි 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට යටත්ව ඉහත සඳහන් ව්‍යවස්ථා ආඥා පනතක් ලෙස සලකා කොමිෂන් සභාව විසින් 1979 අංක 9 දරණ පනත පැනවීමෙන් අනතුරුව එය 1980 ජනවාරි පළමු දින සිට ක්‍රියාත්මක තත්වයට පත් වී ආයතනයේ ක්‍රියාකරිත්වය සඳහා නීතිමය පදනම සකස්කර දෙනු ලබයි පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා මෙරට තුළ ඉඩ ප්‍රස්ථාවන් සංවර්ධනය කිරීම හා මෙරට සීඝ්‍රයෙන් පුළුල්වන කෘෂිකර්ම ක්ෂේත්‍රයට නිසි ලෙස පුහුණු කළ විද්‍යාත්මක පුද්ගලයන් දායාද කිරීම මෙම අද්විතියආයතනය නිර්මාණය කිරීමේ ප්‍රධාන අරමුණු විය.මෙම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පවති

අධ්‍යයන වැඩසටහන්

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා වත්මන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත්කමින් යුතු විවිධ උසස් උපාධි පාඨමාලාවන් සකස් කොට ඇත. රටේ ඉල්ලුමට උචිතවන පරිදි විෂයමාලාවන් ද සංශෝධනය කොට ඇති අතර වර්තමානය වනවිට මෙම ආයතනය දර්ශණශූරී උපාධි ,ව්‍යාපාර පරිපාලන උපාධි සහා විද්‍යාපති උපාධි පාඨමාලාවන් 30ක් පාඨමාලා කටයුතු සහ පර්යේෂණ ද ඇතුලත්ව පිරිනමනු ලබයි.කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි උපාධි වැඩසටහන්වල දී පූර්ණ කාලීන නේවාසික පුහුණුව කෙරෙහි වැඩි අවධානයක් යොමුකරයි. මෙතුළින් පශ්චාත් උපාධි සිසුන්ට ඔවුන්ගේ විශ්ව විද්‍යාල අධ්‍යයන කාලය උපරිම වශයෙන් ප්‍රයෝජන ගැනිමට සහ පර්යේෂණ වැඩසටහන්වලට පූර්ණ වශයෙන් සහභාගිවීමට හැකිවනු ඇත. අධ්‍යයන හා පර්යේෂණ කටයුතු වලට සැලකියයුතු කාලයක් කැපකරන සහ අදාළ ක්ෂේත්‍රයෙහි වැඩි ප්‍රාගුණ්‍යක් අත්කර ගැනිමට කැප වූ විනයගරුක සහ වෙහෙස වී කටයුතු කරන සිසුන් පිරිසක් බිහිකිරීමේ වැදගත් අභියෝගයට කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දී සිටී. එවැනි කැපවීම් තුළින් ආයතනයේ උපාධිධාරින් තුළ ඔවුන්ගේ චරිතවල අවියෝජනීය වූ කොටසක් බවට පත්වන ප්‍රබල කාර්ය ආචාරධර්ම සමුදායක් සංවර්ධනය කිරීම මෙම ආයතනයේ අපේක්ෂාවයි.

ශ්‍රී ලංකා සුදුසුකම් ආකෘතික මාර්ගෝපදේශයන්ට සමානවන ආකාරයෙන් මෙම ආයතනය දැනට පවතින රෙගුලාසි 2017 වසරේ සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කොට ඒ අනුව සිසුන් ඇතුළත් කරගන්නා ලදි. මෙම ආයතනය මගින් ප්‍රදානය කෙරෙන උපාධි වැඩ සටහන් වන්නේ

- විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති-සම්මාන පහක් ඉලක්ක කළ අධ්‍යයන/ව්‍යාපෘති පාඨමාලා වැඩ
- විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති- වසරක පර්යේෂණයක් ඇතුළත් පාඨමාලා වැඩ හා පර්යේෂණ
- දර්ශනපති / දර්ශණශූරී/ ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධි

උක්ත විද්‍යාපති උපාධි සඳහා අදාළ සම්මාන අවශ්‍යතාවන් සපුරන අපේක්ෂකයින්ට පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා සම්පූර්ණ කල හැකිය. සම්මාන 25ක් ලබාගන්නා සිසුන්ට පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද සම්මාන20ක් ලබාගන්නා සිසුන්ට පශ්චාත් උපාධි සහතික පත්‍ර ද ලබාගත හැක. කෙටි කාලයකින් පශ්චාත් උපාධි සුදුසුකම අත්කරගැනිමට අවශ්‍ය කරන අපේක්ෂකයින් වෙනුවෙන් මෙම ආයතනය පශ්චාත් උපාධි සහතික පත්‍ර වැඩ සටහනක් හදුන්වාදුන් ප්‍රථම අවස්ථාව මෙයයි.

ආචාර්ය මණ්ඩලය

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පුළුල් ඉගැන්වීමේ හා පර්යේෂණ අත්දැකීම්වලින් සමන්විත 300 දෙනෙකුගෙන් සමන්විතවන අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු පේරාදෙණිය කෘෂි විද්‍යා පීඨයට අයත්වන අතර ඉතිරි පිරිස විශ්වවිද්‍යාල පද්ධතියේ වෙනත් පීඨවලින් රජයේ දෙපාර්තමේන්තු, පර්යේෂණ ආයතන,සංස්ථා,පුද්ගලික අංශයේ ආයතන,ජාත්‍යන්තර ආයතන හා රාජ්‍ය නොවන සංවිධානවලට අයත්වේ

අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ සිසුන් 476 දෙනෙකු 2020වසරේ දී ලියාපදිංචි වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ

විද්‍යාපති - 429 ව්‍යාපාර පරිපාලනපති - 29 දර්ශනපති 09 දර්ශනශූරි 08 අනියම් -01

2020 වසරේ දී උපාධි ප්‍රදානෝත්සවයේ දී සිසුන්ට උපාධි පිරිනමන ආකාරය පහත පරිදිය

දර්ශනශූරි -15, දර්ශනපති-18,විද්‍යාපති-168,ව්‍යාපාර පරිපාලනපති-05පශ්චාත් උපාධි ඩිප්ලෝමා-27

වාර්ෂික සම්මේලනය

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 32 වැනි වාර්ෂික සම්මේලනය 2020 නොවැම්බර් 19 සහ 20 යන දින වල පවත්වන ලදි.පාංශු විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය ආර්.එස්.ධර්මකීර්ති මහතා මෙහි මෙහි සම්බන්ධීකාරක ලෙස කටයුතු කළේය.

මෙම සම්මේලනයේ ආරම්භක සැසිය එහි සුවිශේෂිත ආරාධිතයන් වූ විශ්ව විද්‍යාලයේ උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, පීඨාධිපතිවරුන්, යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා සහ මාලදිවයින් තානාපති ගරු ඩෙනිස් චයිබ් මහතා සහ ප්‍රධාන දේශක වශයෙන් ඇමරිකාවේ ඔහියෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය රතන් ලාල් මහතාගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි,

දේශීය සහ ඉන්දියාව ඇතුළු ජාත්‍යන්තර රටවල පර්යේෂණ පත්‍ර 39ක් තාක්ෂණික සැසි අටක් යටතේ ඉදිරිපත් කළ අතර පෝස්ටර් ඉදිරිපත් කිරීම 37 ක් ද විය. ඒ අතරින් වඩාත් විශිෂ්ට වූ ඉදිරිපත් කිරීම් වෙනුවෙන් පම්මාන 11ක් ප්‍රදානය කරන ලදි.

(ආ). ජයග්‍රහණ

ආචාර්ය ඒ.ඩබ්.ආර්.ජෝකිම් අනුස්මරණ ත්‍යාග ප්‍රදානය 2001 වර්ෂයේදි ආරම්භ කරන ලද අතර එය අවසන් වසර අවබෝධතා පරීක්ෂණයේදි සාර්ථකව මුහුණ දෙන ඉහළම GAP අගයන් ලබාගන්නා ප්‍රශංසනීය ශිෂ්‍යාට ප්‍රදානය කරන්නකි. 2020 වර්ෂයේ නොවැම්බර් 20 වැනි දින පැවති 32 වැනි වාර්ෂික සමුළුවේදි තම උපාධි පාඨමාලාවේ ඉහළම GAP අගය 4.00 ක් ලබාගත් පහත සදහන් සිසුවියට මුදල් ත්‍යාගය පිරිනමන ලදි.

නම	අධ්‍යයන මණ්ඩලය	උපාධි පාඨමාලාව
ආර්.ඒ.ජී.ඩබ්.රත්නායක	ආහාර විද්‍යාව හා තාක්ෂණය	ආහාර විද්‍යාව සහ පෝෂණය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව (පාඨමාලා වැඩ)

(ඇ) බාධක

කෝවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන්, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උපාධි පාඨමාලාව කල් දැමීමට සිදු වූ අතර එය 2020 වර්ෂයේ උපාධිධාරීන්ගේ අඩුවීමට මූලික විය. දේශන මාර්ගගත ක්‍රමයට මෙහෙයුවද ශිෂ්‍යයින්ගේ පර්යේෂණ කටයුතුවලට දැඩි බාධාවක් මින් ඇතිවිය.මීට අමතරව, සැලසුම් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන කටයුතු කල්දැමීමට සිදුවුවේ පැවති තත්වය මත අධ්‍යයන කටයුතු අතත්‍ය ක්‍රමයට පරිවර්තනය කිරීමේදි අවශ්‍ය වන මාර්ගගත පහසුකම් හා තාක්ෂණ දියුණු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමුකිරීමට සිදුවු බැවිනි.

(ඇ) අනාගත සැලසුම්

- කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ප්‍රමාණවත් , උචිත සහ පහසු සම්පත් සැපයීම් සහ මාර්ගගත ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා සහාය වීම පවත්වා ගැනිමටත් සහතික වීම.
- අභ්‍යන්තර තත්ව සහතික ක්‍රමවේදය යටතේ ගුණාත්මක භාවය සහ තත්වය සහතික කරන ප්‍රතිපත්තින් හා අදල ක්‍රියා පිළිවෙළවල් සමාලෝචනය කිරීම,යාවත්කාලින කිරීම සහ අදාල පාර්ශවයන් වෙත සන්නිවේදනය කිරීම.
- පවත්නා පාඨමාලා පුනරික්ෂණය කිරීම, කෘෂිකර්ම අංශයේ වර්තමාන හා අනාගත අවශ්‍යතා සලකමින් කෙටි කාලින පුහුණු පාඨමාලා හදුන්වා දීම.
- ශිෂ්‍යත්ව සහ ජාතික සහ අන්තර්ජාතික පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික කර්මාන්ත සමග සහයෝගිතා පර්යේෂණ වැඩසටහන් සැපයීම මගින් දිරිගන්වමින් පර්යේෂණ සහිත උපාධිධාරී ශිෂ්‍ය සංඛ්‍යා ඉහළ නැංවීම
- ආයතනයේ වෙබ් අඩවිය නිරන්තර යාවත්කාලීන කිරීම තුලින් දෘශ්‍යතාව වර්ධනය කිරීම සහ

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුවතිපත් ලිපි/ කාලීන ප්‍රකාශන නියමිත කාල පරාසය තුල ප්‍රකාශනය කිරීම හා සාමාන්‍ය සහ විද්‍යුත් මාධ්‍ය හරහා ඒවා බෙදා හැරීම තුලින් සියළුම පාඨමාලා සඳහා වාර්ෂික ශිෂ්‍ය ලියාපදංචිය ඉහළ දැමීම.

- ශිෂ්‍ය ප්‍රතිචාර ලබාගැනීමේ ක්‍රමවේදය තුලින් අධ්‍යයන හා පරිපාලන ක්‍රියාපටිපාටි අඛණ්ඩව වර්ධනය කිරීම.
- සියළුම අංශවල වඩා හොඳ ක්‍රියා පැවැත්මක් උදෙසා යහ පුරුදු අභ්‍යන්තරීකරණය කිරීම.

- නවතම සංවර්ධිත පන්ති කාමර සහ උසස් ගණයේ පර්යේෂණ කිරීම සඳහා විද්‍යාගාර පහසුකම් සැලසීම, බාහිර කාර්යමණ්ඩල සහ විදේශීය සිසුන් වෙනුවෙන් නවාතැන් පහසුකම් සහ විවේක ගැනීම් පහසුකම් සලසා දීම මූලික කොට ගත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- තිරසර සංවර්ධන ප්‍රතිපත්තීන්ට අනුකූල වන සේ පරිසරය ආරක්ෂා කරමින් සහ හානිය අවම කරමින් සියළු උපායමාර්ගයන් ක්‍රියාත්මක කිරීම හා සියළු අදාළ පාර්ශවයන් ඒ පිළිබඳව දැනුවත් කිරීම.

(ආ) ශිෂ්‍ය බඳවා ගැනීම්

ආ.1 2020 දෙසැම්බර් 31 වැනි දිනට සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

ආ) ශිෂ්‍ය බඳවා ගැනීම්
ආ.1 2020 දෙසැම්බර් 31 වැනි දිනට සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

අධ්‍යන පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	කාර්ය මණ්ඩල ව්‍යාප්තිය (ස්ථිර කාර්ය මණ්ඩලය පමණි)			
		අධ්‍යයන කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය	අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	මුළු ගණන
අනියම්	01	2	37	01	40
දර්ශනපති	90				
විද්‍යාපති (පාඨමාලා)	1112				
විද්‍යාපති(පාඨමාලා හා පර්යේෂණ)	231				
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා)	141				
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා සහ පර්යේෂණ)	66				
දර්ශනශූරී	99				
මුළු ගණන	1740	2	37	01	40

ආ.2 පශ්චාත් උපාධි පාඨමාලා සඳහා දේශීය ශිෂ්‍ය ලියාපදිංචිය - 2020

අධ්‍යයන පාඨමාලාව	පූර්ණ කාලීන/අර්ධ කාලීන	නව බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2020)			ශිෂ්‍ය ලියාපදංචිය (2020 දෙසැම්බර් 31 දිනට ලියාපදංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව			උපාධිධාරීන් සංඛ්‍යාව
		පුරුෂ	ස්ත්‍රී	මුළු ගණන	පුරුෂ	ස්ත්‍රී	මුළු ගණන	

අනියම්	අර්ධ කාලීන	0	1	1	0	1	1	0
දර්ශනපති	පූර්ණ කාලීන	1	8	9	29	61	90	19
විද්‍යාපති (පාඨමාලා)	පූර්ණ කාලීන	85	252	337	357	755	1112	110
විද්‍යාපති(පාඨමාලා සහ පර්යේෂණ)	පූර්ණ කාලීන	28	64	92	56	175	231	2
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා)	පූර්ණ කාලීන	14	11	25	77	64	141	23
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා සහ පර්යේෂණ)	පූර්ණ කාලීන	1	3	4	39	27	66	0
දර්ශනශූරී	පූර්ණ කාලීන	4	4	8	47	48	95	10
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	පූර්ණ කාලීන	0	0	0	0	0	0	7
මුළු ගණන		133	343	476	605	1131	1736	171

ඇ.3 පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විදේශීය ශිෂ්‍ය ලියාපදිංචිය - 2020

අධ්‍යයන පාඨමාලාව	පූර්ණ කාලීන/අර්ධ කලීන	නව බඳවා ගැනීම (ජනවාරි - දෙසැම්බර් 2020)			ශිෂ්‍ය බඳවා ගැනීම (2020 දෙසැම්බර් 31 දිනට මුළු ශිෂ්‍ය ලියාපදිංචිය)		
		පුරුෂ	ස්ත්‍රී	මුළු ගණන	පුරුෂ	ස්ත්‍රී	මුළු
දර්ශන ශූරී	පූර්ණ කාලීන	0	0	0	0	4	4

ශිෂ්‍ය ලියාපදිංචිය 2018-2020 පේරාදෙණිය සහ කොළඹ



(ඇ) කාර්ය මණ්ඩල විස්තර

සේවා කාණ්ඩය	වැටුප් ක්‍රේතය	31/12/2017 දිනට අනුමත	වර්තමාන සේවක සංඛ්‍යාව
ප්‍රාථමික මට්ටම		18	
ප්‍රාථමික ශ්‍රේණිය - පහළ	PL - 1		7
ප්‍රාථමික ශ්‍රේණිය - මධ්‍යම	PL - 2		4
ප්‍රාථමික ශ්‍රේණිය - ඉහළ	PL - 3		7
ද්විතියික ශ්‍රේණිය		21	
කළමණාකාර සහකාර- තාක්ෂණික නොවන	U-MN 1		15
කළමණාකාර සහකාර- තාක්ෂණික	U-MT 1		-
සහකාර නිලධාරි - 2 ශ්‍රේණිය	U-MN 2		-
සහකාර නිලධාරි - 1 ශ්‍රේණිය	U-MN 3		-
මාණ්ඩලික සහකාර / ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN 4		6
තෘතීයික මට්ටම		2	
අධ්‍යයන සහයක - 2 ශ්‍රේණිය	U-AS 1		-
විධායක සහකාර / සහකාර කළමණාකාර	U-EX 1		1
අධ්‍යයන සහයක - 1 ශ්‍රේණිය	U-AS 2		1
ජ්‍යෙෂ්ඨ මට්ටම		11	
වෛද්‍ය නිලධාරි	U-MO 1		-
ප්‍රධාන වෛද්‍ය නිලධාරි	U-MO 2		-
සහකාර විධායක නිලධාරි	U-EX 2		1
සහකාර විධායක නිලධාරි	U-EX 2 (a)		1
විධායක නිලධාරි	U-EX 3		-
කථිකාචාර්ය	U-AC 3		8
සහකාර මහාචාර්යවරු	U-AC 4		-
මහාචාර්යවරු / ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු	U-AC 5		1

(ඇ) පර්යේෂණ නිමැවුම් දත්ත

ඇ .1. 2020 වර්ෂයේ ප්‍රකාශක නිමැවුම්

ඇ. 1.(අ) 2020 දී යොමුකරන ලද (සුවිගත සහ සුවිගත නොකළ) සගරාවල ප්‍රකාශන ලැයිස්තුව

අධ්‍යක්ෂක/ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ සහකාර පුස්තකාලයාධිපති හැර ආයතනයට ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති හෙයින් සියළුම අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිදුකරන ලබන්නේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයන් විසින් වන හෙයින් ඔවුන් විසින් පළකරන ලද ප්‍රකාශන පේරාදෙණිය විශ්ව විද්‍යාලය යටතේ ලැයිස්තුගත කර ඇත.

(ඇ) .2. 2020 දී ලද ජාතික හා ජාත්‍යන්තර සම්මාන .

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සමුළුව 2020

සැසිය	සම්මානය/ හොඳම පත්‍රිකාව (පත්‍රිකාවේ නම සහ සම්මානයේ අරමුණ	ජාතික / ජාත්‍යන්තර හෝ වෙනත්	ලාභියාගේ නම / නම්	තනතුර	පීඨය / අධ්‍යයන අංශය
පෝෂණය සහ ආහාරවල ගුණත්වය	සැසියේ හොඳම ඉදිරිපත් කිරීම - වාචික ශ්‍රී ලංකාවේ වගාකරන තෝරාගත් එළබටු විශේෂවල පෝෂණ පැතිකඩ පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය	ජාතික	වි.එච්.එච්. නදීෂානි	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.
කෘෂි විද්‍යාව සහ ශාක බෝ කිරිම	සැසියේ හොඳම ඉදිරිපත් කිරිම - වාචික සංරක්ෂිත උක්වල (saccharum spp.) ගුණංගිකරණය හා පාරසරික වශයෙන් වැදගත් ගතිලක්ෂණ දීශාභිමුඛ අභිජනනය	ජාතික	බී. කිරිවත්තුඩාව	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.
සංවිධාන කළමණාකරණය හා ව්‍යාප්තිය	සැසියේ හොඳම ඉදිරිපත් කිරිම- වාචික රැකියා තෘප්තිය සඳහා චිත්තවේදි බුද්දිමය බලපෑම -ශ්‍රී ලංකාවේ ප්‍රධාන ඇමතුම් මධ්‍යස්ථානයක අධ්‍යයනයක්	ජාතික	ටී.එස්.පී ජයවීර	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.
කෘෂිකාර්මික පද්ධතියේ ආර්ථික කාර්යක්ෂමතාවය	සැසියේ හොඳම ඉදිරිපත් කිරිම- වාචික නිෂ්පාදන සාධක සඳහා ලැබෙන ප්‍රතිලාභ සහ ශ්‍රී ලංකාවේ පොල් වගාවෙහි සමස්ථ සාධක ඵලදයිතාවය	ජාතික	එම්.ජී.ඩී. අබේසේකර	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.
ආහාරවල ක්‍රියාකාරි ගුණාංග	සැසියේ හොඳම ඉදිරිපත් කිරිම- වාචික ශ්‍රී ලංකාවේ වික්ටෝරියා ජලාශයේ ඇමේසන් සෙල්ෆින් අගුළුවානම් මත්ස්‍යාගේ මාළු ප්‍රෝටීන හයිඩ්‍රොලිසයිට් වල ජෛව ක්‍රියාකාරි ගුණාංග	ජාතික	එස්.කේ.ඩී. විජේසිංහ	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.

සැසිය	සම්මානය/ භෙදම පදිංචිකාඩ නම (පදිංචිකාඩ නම) සම්මානයේ සහ අර්ථ	ජාතික / ජාත්‍යන්තර හෝ වෙනත්	ලාභියාගේ නම / නම	කනකුර	පීඨය / අධ්‍යයන අංශය
ක්ෂුද්‍රජීවී විද්‍යාව සහ පෛව තාක්ෂණ ආකෘතිකරණය සහ පුරෝකථනය	සැසියේ හොඳම ඉදිරිපත් කිරීම- වාචික බ්‍රොයිලර් කුකුළුමස් වල පෛව පටල සැදීමේ හැකියාව	ජාතික	ඩබ්.ඒ.එම්. ප්‍රනාන්දු	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.
ආකෘතිකරණය සහ පුරෝකථනය	සැසියේ හොඳම ඉදිරිපත් කිරීම- වාචික ශ්‍රී ලංකාවේ තෙත් කලාපිය දෙවැනි අන්තර් මෝසම් වර්ෂාපතනය මත ඉන්දියානු සාගර ද්විධ්‍රැව සිදුවීම්වල බලපෑම	ජාතික	ඒ.බී. අබේසේකර	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.
කඳුරැලි පද්ධතිවල සම්පත් කළමණාකරණය	සැසියේ හොඳම ඉදිරිපත් කිරීම- වාචික ශ්‍රී ලංකාවේ මහකණුමුල්ල ග්‍රාමයේ වැව අශ්‍රිත කඳුරැලි පද්ධතියේ අවකාශීය විචලනතාවය පස සහ ජලය තක්සේරු ක්‍රම භාවිතයෙන් ආකෘති කරණය කිරීම	ජාතික	එම්.ආර්.සි.පී වික්‍රමසිංහ	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.
භෝග හා පාංශු විද්‍යාව	සැසියේ හොඳම ඉදිරිපත් කිරීම- පෝස්ටර් ශ්‍රී ලංකාවේ අනුරාධපුර වගා කරන හාල් වලට ඇතිවන දිලිර රෝගයක් වන **Narrow Brown Leaf Spot** වල ඇතිවීම හා බරපතලකමට නයිට්‍රජන් පොහොර , වල් පැල සහ වගා සනත්වයේ බලපෑම	ජාතික	ඩබ්.එම්.ඩී. එම්. වික්‍රමසිංහ	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.
සම්පත් කළමනාකරණය සහ ව්‍යාප්තිය	සැසියේ හොඳම ඉදිරිපත් කිරීම - පෝස්ටර් ශ්‍රී ලංකාවේ අල වගාව සඳහා කෘෂිකාර්මික යහ පුරුදු පිළිබඳ ජංගම උපදේශන අකෘතියක් යෝජනා කිරීම	ජාතික	ඒ.ටී.ඥානදි	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.
ආහාර හා කෘෂිකර්මාන්තය කෙරෙහි තාක්ෂණය මැදිහත්වීම	සැසියේ හොඳම ඉදිරිපත් කිරීම- පෝස්ටර් වී වගා පසෙන් DNA ඇදගන්නා විභව වාහකයින් පිළිබඳ ඇගයීම	ජාතික	ටී.ඩී.රණසිංහ	ශිෂ්‍ය	කෘ.වි.ප.උ.ආ.

ඇ.3 2020 වර්ෂයේ සාමාන්‍ය ජනතාව වෙත දැනුම බෙදාහැරීම පිළිබඳ විස්තර

ආයතනය	වැඩසටහන් වර්ගය (වැඩමුළු/සුහුණු වැඩසටහන් / කෙෂ්ත්‍ර නිරීක්ෂණ/මාධ්‍ය වැඩසටහන්)	වැඩසටහන් මාතෘකාව	සංවිධානය කිරීම. පිළිය /අධ්‍යයන අංශය /මධ්‍යස්ථානය / ඒකකය	පැවැත්වූ දිනය	කාල සීමාව	ඉලක්ෂිත කණ්ඩායම	සහභාගිවූ සංඛ්‍යාව
කෘ :ප: උ: ආ	වැඩමුළුව	ගුණාත්මක පර්යේෂණ ලිපියක් ලිවීම- ක්‍රම සහ විධි පිළිබඳ මාර්ගගත වැඩමුළුව	සමුළු සංවිධාන කමිටුව	2020.07.31 2020.08.01 2020.08.07	දින 03	ඉදිරි සති දෙකක කාල සීමාවේදි කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සමුළුව සඳහා හෝ වෙනයම් අන්තර්ජාතික සගරාවට අත්පිටපත් භාරදීමට අපේක්ෂිත පශ්චාත් උපාධි හදරන සිසුන්	25
කෘ :ප: උ: ආ	වැඩමුළුව	ශ්‍රේෂ්ඨ සම විචාරකයෙකු බවට පත්වන්නේ කෙසේද පිළිබඳ වැඩ මුළුව	සමුළු සංවිධාන කමිටු	2020.09.22	දින 01	පර්යේෂණ කෘතියක සාර්ථක සමවිචාරකයෙකු වීමට ඇවැසි ඕනැම අයෙක් .මෙම වැඩමුළුව අධ්‍යයන මෙන්ම සිසුන් වෙනුවෙන්ද විවෘතව තිබුණි	20
කෘ :ප: උ: ආ	වැඩමුළුව	අත්පිටපතක විචාරක නිර්දේශයන්ට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ මාර්ගගත වැඩ මුළුව	සමුළු සංවිධාන කමිටුව	2020.09.29	දින 01	පර්යේෂකයින් ශිෂ්‍යයින්	48

ආයතනය	වැඩසටහන් වර්ගය (වැඩමුළු/පුහුණු වැඩසටහන් / නිරූපන/මාධ්‍ය ක්ෂේත්‍ර වැඩසටහන්)	වැඩසටහන් මාතෘකාව	සංවිධානය කිරීම. සියය /අධ්‍යයන අංශය /මධ්‍යස්ථානය / ඒකකය	පැවැත්වූ දිනය	කාල සීමාව	ඉලක්කගත කණ්ඩායම	සහභාගිවූ සංඛ්‍යාව
කෘ :ප: උ: ආ	වැඩමුළුව	ඉදිරිපත් කිරීමේ කුශලතා පුහුණුව ඉහළ බලපෑමක් ඇති කළ හැකි ඉදිරිපත් කිරීම නිර්මාණය සහ සන්නිවේදනය පිළිබඳ මාර්ගගත වැඩමුළුව	සමුළු සංවිධාන කමිටුව	2020.11.06 හා 07	දින 02	උපාධි හදාරන සිසුන් සහ පර්යේෂකයින්	27
කෘ :ප: උ: ආ	පුහුණුවීම	දැනුවත් කිරීමේ සහ කුශලතා වර්ධනය කිරීමේ ප්‍රජා පුහුණු වැඩ මුළුව - WASH	කැප් - නෙට් ලංකා සහ ව(ර්)ල්ඩ් විෂන් ලංකා	2020.02.07 -09	දින 03	ප්‍රජා මූලික සෞඛ්‍යාරක්ෂක කම්කරුවන්	30
කෘ :ප: උ: ආ		කෝවිඩ් 19 සහ වැළැක්වීම පිළිබඳ පෝස්ටර් ප්‍රචාරණය	කැප් - නෙට් ලංකා, ව(ර්)ල්ඩ් විෂන් ලංකා, දරුවන් සුරැකීම, සෞඛ්‍ය සේවා කලාප අධ්‍යක්ෂ නුවරඑළිය සහ දිස්ත්‍රික් ලේකම් නුවරඑළිය -ය	2020 ජූලි		පාසැල් සිසුන්	
කෘ :ප: උ: ආ	පුහුණුවීම	බදුල්ල සහ නුවරඑළිය ප්‍රදේශයන්හි ප්‍රජා මූලික ජල සංගම් නායකයින්ගේ ධාරිතා ප්‍රවර්ධන පුහුණු සැසිය	කැප් - නෙට් ලංකා, ව(ර්)ල්ඩ් විෂන් ලංකා	2020.07.11	දින 01	බදුල්ල සහ නුවරඑළිය ප්‍රදේශයන්හි ප්‍රජා මූලික ජල සංගම් නායකයින්	102

ආයතනය	වැඩසටහන් වර්ගය (වැඩමුළු/සුහුණු වැඩසටහන් / ක්ෂේත්‍ර නිරීක්ෂණ/මාධ්‍ය වැඩසටහන්)	වැඩසටහන් මාතෘකාව	සංවිධානය කිරීම. පියය /අධ්‍යයන අංශය /මධ්‍යස්ථානය / ඒකකය	පැවැත්වූ දිනය	කාල සීමාව	ඉලක්කගත කණ්ඩායම	සහභාගී වූ සංඛ්‍යාව
කෘ :ප: උ: ආ	පුහුණුවීම	බදුල්ල සහ නුවරඑළිය ප්‍රදේශයන්හි ප්‍රජා මූලික ජල සංගම් ප්‍රජා මූලික ජල සම්පත් කළමණාකරණ හා සුරැකීම් නායකත්වයන්ගේ ධාරිතා ප්‍රවර්ධන පුහුණුව	කැප් - නෙට් ලංකා සහ ව(ර්)ල්ඩ් විෂන් ලංකා	2020.07.18	දින 01	බදුල්ල සහ නුවරඑළිය ප්‍රදේශයන්හි ප්‍රජා මූලික ජල සංගම් නායකයින්	100

ඉ. ජාත්‍යන්තරීකරණය

ඉ.1. 2020 වර්ෂයේදී ආයතනය විසින් පවත්වන ලද අන්තර්ජාතික සමූළු සහ වැඩමුළු පිළිබඳ විස්තර

අංකය	තේමාව	සංවිධානය කිරීම (පීඨය / අධ්‍යයනඅංශය /මධ්‍යස්ථානය/ඒකකය)	පැවත්වූ දිනය/ කාල සීමාව	ඉලක්ක ගත කණ්ඩායම	සහභාගී වූවන් සංඛ්‍යාව
1	වාර්ෂික සම්මේලනය	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	2020 නොවැම්බර් 19 - 20 (දින 02)	පශ්චාත් උපාධි හදාරන සිසුන්, පර්යේෂකයින්, අධ්‍යයන කාර්ය මණ්ඩල කර්මාන්ත ප්‍රවීණයන්	මර්ග ගත සහභාගී වූවන් 250 ක්

ඉ.2 2020 වර්ෂයේදී ප්‍රථම උපාධියන් සඳහා ඉගැන්වීම / පශ්චාත් උපාධි ඉගැන්වීම / සම්මන්ත්‍රණ / වැඩමුළු සඳහා අන්තර්ජාතික කාර්ය මණ්ඩල පැමිණීම පිළිබඳ තොරතුරු.

ආයතනය	වැඩසටහනේ නම	පුද්ගලයාගේ නම	රට/ විශ්වවිද්‍යාලය	කාර්ය මණ්ඩල
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	වාර්ෂික සම්මේලනය	ඩෙනිස් චායිබ් මහතා	ශ්‍රී ලංකා සහ මාලදිවයින් යුරෝපා සංගම් නියෝජිත තානාපති	මාර්ග ගත සහභාගිත්වය
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	වාර්ෂික සම්මේලනය	මහාචාර්ය රතන් ලාල්	ඔහියෝ රාජ්‍ය විශ්වවිද්‍යාලය, ඇ.එ.ජ.	
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	වාර්ෂික සම්මේලනය	මහාචාර්ය ජෝන් ඩික්සන්	කුවින්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියන් ජාතික විශ්වවිද්‍යාලය ගන්සු කෘෂිකාර්මික විශ්වවිද්‍යාලය	
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	වාර්ෂික සම්මේලනය	ජෝන් ඩබ්. ක්‍රෝෆෝඩ්	ග්ලාස්ගෝව් විශ්වවිද්‍යාලය	

ඊ. 2020 වර්ෂය සඳහා ඉලක්ක කරන ලද තිරසාර බව හා බැඳුණු වැඩසටහන්.

1. කාර්ය මණ්ඩල සමාජිකයින් සඳහා පාරිසරික දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත්වීම
2. පාසැල් දරුවන් සහ ගොවීන් සඳහා පරිසරය හා සම්බන්ධ කෙටිකාලීන පාඨමාලා සහ වැඩසටහන් පැවත්වීම.
3. කඩදාසි රහිත මාර්ග ගත අයදුම් කිරීමේ ක්‍රියාවලිය ප්‍රවර්ධනය / දිරිගැන්වීම.
4. ඉවතලන කඩදාසි, පොලිතීන් සහ ජෛව භායනය කළ හැකි කොටස් වෙන් කිරීම හා ප්‍රතිචක්‍රිය කරණය කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම.
5. ලිපි ද්‍රව්‍ය (ලියුම් කවර හා කඩදාසි) නැවත භාවිතා කිරීම සහ අඛන්ඩ දැනුවත් කිරීමේ වැඩ සටහන් මඟින් නාස්තිය අවම කිරීම.
6. තිරසාරභාවය හා සම්බන්ධ පාඨමාලා මොඩියුල 100 කට අධික ප්‍රමාණයක් පිරිනැමීම සඳහා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පාඨමාලා මොඩියුල පවත්වාගෙන යාම.
7. කඩදාසි රහිත ඵලදායී සන්නිවේදන පද්ධති වන විද්‍යුත් තැපෑල, කළමණාකරණ තොරතුරු පද්ධති සහ කෙටි පණිවුඩ පවත්වාගෙන යාම.
8. බලශක්ති කාර්යක්ෂමතාවය උදෙසා සාමාන්‍ය ප්ලොරසන්ට් විදුලි බුබුළු වෙනුවට LED පැනල ක්‍රමයන් භාවිතයට ගැනීම.

කෘෂිකර්ම පුස්තකාලය

වාර්ෂික වාර්තාව - 2020

2020 දී ලද පුස්තකාල ප්‍රතිපාදන .

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ලද ප්‍රතිපාදනය	රු.	500,000,00
පියයෙන් ලද ප්‍රතිපාදනය	රු.	0
මුළු ප්‍රතිපාදනය	රු.	500,000,00

මිලදී ගැනීම් - පොත්

2020 වර්ෂයේදි කෘෂිකර්ම පියයේ සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් එම ආයතනවල ඉගැන්වීම් කාර්ය සඳහා ගැලපෙන පරිදි නිර්දේශ කරන ලද පෙළපොත් වලින් සමන්විත පොත් 13ක් පුස්තකාල පොත් එකතුවට එකතු කරන ලදි.

එකතුවට අළුතින් එකතු කරන ලද පොත්වල විස්තර .

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුදල් වලින් මිලදි ගත් පොත් ගණන		13
වටිනාකම	රු,	160709.36
පියා ප්‍රතිපාදන මගින් මිලදි ගත් පොත් ගණන		01
වටිනාකම	රු,	2990.00
මිලදි ගත් මුළු පොත් ගණන (කෘ.ප.උ.ආ සහ පියය)		14
එකතුවට එක්වූ කෘ.ප.උ.ආ. නිබන්ධන ගණන		21

පරිත්‍යාග

වෙනත් පරිත්‍යාග ශිලින්ගෙන් ලැබුණු පොත් ගණන		
වටිනාකම	රු.	24758.50
එකතු වූ මුළු පොත් සංඛ්‍යාව		101

වර්ෂය තුල පොත් සහ වාර සඟරා පරිත්‍යාග කළ වැදගත් පරිත්‍යාග ශිලින්

පරිත්‍යාගශිලියා		වටිනාකම
කෘෂිකාර්මික ජීව විද්‍යා අංශය,පේරාදෙණිය විශ්ව විද්‍යාලය	රු.	4649.50
සංගණක සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,කොළඹ	රු.	2455.50
ආසියානු පදනම, කොළඹ	රු.	2509.00

වාර සඟරා

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් මඟින් වාර සඟරා මාතෘකා එකක් සඳහා 2020 වර්ෂයේදී දයකත්වය සපයන ලදි.

පුස්තකාල පරිශීලක කාණ්ඩ

2020 දී ලියාපදිංචි පුස්තකාල පරිශීලකයින් 2711 ක් විය . විස්තර පහත දැක්වේ .

පශ්චාත් උපාධි සිසුන්	1148
උපාධි අපේක්ෂකයින්	1378
අධ්‍යයන කාර්යය මණ්ඩලය	170
අනධ්‍යයන කර්යය මණ්ඩලය	10
ලිපිකාර හා සමාන්තර සේවා	06
මුළු ගණන	2711

පුස්තකාල පොත් භාවිතය

2020 වර්ෂයේදී පොත් 244 ක් සිසුන් අතර සංසරණය වී තිබේ .

අන්තර් පුස්තකාල ණය .

වෙනත් පුස්තකාලවලින් ලිපි ඉල්ලා අයදුම් 28 ක් ලැබුණි.
අපි ලිපි 15 ක් වෙනත් පුස්තකාලවලට යැවිවෙමු.

අපි ලිපි දෙකක් වෙනත් පුස්තකාලවලින් ඉල්ලා සිටියෙමු.
අප වෙත ලිපි දෙකක් වෙනත් පුස්තකාලවලින් ලැබිණි.

සාහිත්‍ය කරුණු සෙවීම

පීඨයේ සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සිසුන් විසින් සාහිත්‍ය කරුණු සෙවීම සඳහා **CAB CD – ROM** දත්ත පදනම භාවිතා කරනු ලබයි. 2020 වර්ෂය තුලදි **CAB** සෙවීම 2ක් සිදු කරණ ලදි.

කාර්යය මණ්ඩලය සහභාගි වූ පුහුණු/ වැඩමුළු

1. පුස්තකාල තොරතුරු සහායක ඩී.අබේසුරිය , පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේදී පවත්වන ලද කළමණාකරණ සහකාර සහ සමාන්තර ශ්‍රේණි කාර්යය මණ්ඩල සඳහා පැවති දින හයක අභිප්‍රේරණ වැඩ සටහනට සහභාගි විය.

වැඩමුළුව පැවති දිනයන්

- 2019 නොවැම්බර් 29වැනි දින
- 2019 දෙසැම්බර් 17වැනි දින
- 2020 ජනවාරි 03 වැනි දින සහ 22වැනි දින
- 2020 පෙබරවාරි 19 වැනි දින සහ 26 වැනි දින

එච්.එන්.කේ.දිසානායක මිය.
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලායාධිපතිනි / කෘෂිකර්ම පුස්තකාලය

26.01.2021

මූල්‍ය කාර්ය සාධනය

13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

විෂය	2018 (රු.)		2019 (රු.)		2020 (රු.)	
	වෙන් කරන ලද	සත්‍ය අගය	වෙන් කරන ලද	සත්‍ය අගය	වෙන් කරන ලද	සත්‍ය අගය
අ) පුද්ගලික පඩිනඩි	**93,932,000**	76,342,142	**89,768,132**	91,720,781	**93,491,000**	78,037,775
ආ) ගමන් වියදම්	**100,000**	83,189	**60,000**	51,230	**55,000**	23,749
ඇ) සැපයීම්	**2,925,000**	2,317,049	**2,975,000**	2,813,287	**2,055,000**	1,578,481
ඈ) නඩත්තු	**1,625,000**	1,542,693	**1,060,000**	1,161,277	**1,255,000**	1,023,430
ඉ) කොන්ත්‍රාත් සේවා	**8,575,000**	6,599,253	**8,260,000**	5,051,299	**6,785,000**	6,512,824
ඊ) වෙනත්	**27,143,000**	38,341,490	**23,898,000**	46,446,518	**18,114,000**	35,634,398
එකතුව	**134,300,000**	125,225,815	**126,021,132**	147,244,392	**121,755,000**	122,810,687
මූල්‍ය ප්‍රභවය:						
රජයේ ප්‍රතිපාදන	**50,000,000**		**60,000,000**		**58,500,000**	
%ක් වශයෙන්	**37%**		**48%**		**48%**	
උත්පාදනය කළ මුදල්	**84,300,000**		**66,021,132**		**63,255,000**	
%ක් වශයෙන්	**63%**		**52%**		**52%**	



2020 වසරෙහි ආයතනයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද මුදල පිළිවෙලින් රු. මිලියන 58.0 ක් හා රු. මිලියන 0.5 ක් විය. එය පසු ගිය වසර හා සසඳා බලන විට පුනරාවර්තන වෙන්කිරීම්වල රු. මිලියන 1.5 ක් පමණ අඩුවීමකි. මෙම වර්ෂයේ මුළු තත්‍ය පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම පිළිවෙළින් රු. මිලියන 122.81 ක් හා රු. මිලියන 13.46 ක් විය. මූලික වශයෙන් පුනරාවර්තන වියදමෙන් 52%ක් උත්පාදනය කරන ලද ප්‍රතිපාදන වලින් ද ඉතිරි 48% ඒකාබද්ධ අරමුදලෙන් ද ආවරණය කරන ලදී. පුනරාවර්තන වියදම්වලින් 63.54%ක් පමණ ස්ථිර කාර්ය මණ්ඩලයේ මෙන්ම බාහිර කථිකාචාර්යවරුන්ගේ වැටුප් හා වේතන ද ඇතුලත්ව පුද්ගලික පඩිනඩි සඳහා වියදම් කොට ඇත. ඉතිරි පුනරාවර්තන වියදම් 29.02%ක ප්‍රමාණය පාඨමාලාවලට අවශ්‍ය ද්‍රව්‍ය, විශේෂ සේවා සැපයීම, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ගමන් වියදම්, වාර්ෂික සමුළුව යනාදී වියදම් සඳහා භාවිතා කෙරිණි. ඉහත දැක්වෙන රූප සටහනෙන් පුනරාවර්තන වියදම් සංයුතිය පිළිබිඹු වේ.

14. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

විෂය	2018 (රු.)		2019 (රු.)		2020 (රු.)		
	වෙන් කිරීම්	සත්‍ය අගය	වෙන් කිරීම්	සත්‍ය අගය	වෙන් කිරීම්	රජයේ ප්‍රධාන	සත්‍ය අගය
අ) ගොඩනැගිලි හා ව්‍යුහ ප්‍රතිසංස්කරණය හා වැඩි දියුණු කිරීම්	**31,600,000**	6,444,298	**10,500,000**	3,000,000	**3,000,000**	-	97,035
ආ) රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ අත්පත් කර ගැනීම	**2,520,000**	465,200	**12,145,000**	-	**8,000,000**	500,000	5,724,115
ඇ) ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම	**3,335,000**	1,123,830	**6,233,878**	985,000	**3,000,000**	-	1,559,095
ඈ) වෙනත් - පුස්තකාල පොත් හා වාර සඟරා	**1,000,000**	444,967	**500,000**		**250,000**		163,709
ඉ) පරිගණක සහ මෘදුකාංග	**4,500,000**	4,397,718	**10,000,000**	925,000	**6,700,000**	-	5,909,605
ඊ) ක්‍රීඩා උපකරණ	**600,000**	733,900	**500,000**	90,000	**150,000**	-	12,480
එකතුව	**37,470,000**	13,609,914	**39,878,878**	13,609,914	**39,878,878**	500,000	13,466,038

COMPOSITION OF CAPITAL EXPENDITURE - 2020



ප්‍රාග්ධන ආයෝජනයෙන් 0.72% ක් හෙවත් ආසන්න වශයෙන් රුපියල් මිලියන 0.09 ක් ආයතනයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය වෙනුවෙන් වැයකරන ලද අතර ප්‍රාග්ධන ආයෝජනයෙන් 98.07% ක් හෙවත් ආසන්න වශයෙන් රුපියල් මිලියන 12.74 ක් ආයතනයේ පංතිකාමර සහ පරිගණක විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ අත්පත් කරගැනීම සඳහා වෙන්කරන ලදී. තවද රුපියල් මිලියන 1.22 කට ආසන්න මුදලක් කෘෂිකර්ම විද්‍යා පුස්තකාලයට පොත්පත් සහ වාර සඟරා මිලදී ගැනීම සඳහා වැයකරන ලදී. ඉහත දැක්වෙන රූප සටහනෙන් ප්‍රාග්ධන වියදම් සංයුතිය පිළිබිඹු වේ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ හෙලිදරව් කිරීම.

1). පොදු කරුණු

2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වූ කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශනය 1979 අංක 09 දරණ කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥා පනතේ 12(3)(ඉ) සහ 19(1) සහ 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාලපනතේ අංක 106(1) සහ 107(ආ) වගන්ති සහ ඉන්පසුව නීති ප්‍රකාරව කරන ලද සංශෝධන හා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව සකස් කොට ඇත.

2) අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 ගිණුම්කරණයට මුල් වූ පදනම

මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වලින් (මූල්‍ය ප්‍රකාශන) සමන්විත ආයතනයේ මූල්‍ය වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, පිළිවෙලින් 2009,2012 සහ 2018 වර්ෂයන්හිදී ප්‍රකාශයට පත්තරන ලද අදාළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ☞ , II හා ☞☞I වන වෙළුම, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ 1971 අංක 38 දරන මුදල් පනත සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද උපදෙස්මාලාව අනුව උපචිත පදනම මත පිළියෙල කොට ඇත.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේ දී පසුගිය වර්ෂයේ අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිම අනුගමනය කොට ඇත. අවශ්‍ය තැන් වලදී ,විමර්ෂණයට භාජනය කරනු ලබන වර්ෂයට අනුකූල වන පරිදි සංසන්දනාත්මක අගයන් ගැලපුම් කොට ඇත. නමුත් ගිණුම් වලට බලපාන්නා වූ උද්ධමනාත්මක සාධක සඳහා ගැලපුම් සිදුකොට නොමැත.

3) දේපළ , පිරියත හා උපකරණ

3.1 දේපළ, පිරියත හා උපකරණ එහි ප්‍රත්‍යාගණන අගය අනුව වාර්තා කොට ඇති අතර ක්ෂය වීම් 1995 ඔක්තෝබර් 05 අංක 649 දරන විශ්විද්‍යාල කොමිෂන් සභා චක්‍ර ලේඛය ප්‍රකාරව ගණනය කොට ඇත. මූල්‍ය කාර්යය සාධන වාර්තාවටම මෙම ක්ෂය වීම් සරල මාර්ග පදනම මත ගණනය කොට ඇත.

එසේම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ චක්‍රලේඛ විධිවිධාන පරිදි දේපළ, පිරියත හා උපකරණ වල ක්ෂය අනුපාත තීරණය කොට ඇත.

දේපදේපළ, පිරියත හා උපකරණ	ක්ෂය වීමේ අගය (වර්ෂයකට ප්‍රතිශතයක් ලෙස)	
1. ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	05
2. කාර්යාලයීය උපකරණ	-	20
3. පරිගණක සහ මෘදුකාංග	-	20
4. ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	-	10
5. රසායනාගාර , ඉගැන්වීම් හා කාර්යාලයීය උපකරණ	-	20
6. මෝටර් රථ	-	20
7. පුස්තකාල පොත් සහ වාර සඟරා	-	20
8. ක්‍රීඩා උපකරණ	-	20
9. භූමි අලංකාර ව්‍යාපෘතිය	-	05

යම් වත්කමක් භාවිතයට ගැනීමේ ආරම්භයක් සමඟම එය ක්ෂය වීමට පටන් ගන්නා අතර , එකී වත්කම විකිණීමට හෝ හඳුනානොගැනීමට තීරණය කරනු ලබන දිනවලින් කළින් එළැඹි දින සිට එම ක්ෂය වීම් නවතී.

3.2 කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් ලෙස පිහිටුවා ඇති බැවින් මෙම ආයතනය පිහිටි භූමියේ අයිතිය නීත්‍යානුකූලව එයට පවරා ගෙන නොමැත. එබැවින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේ දී එකී ඉඩමේ වටිනාකම සැලකිල්ලට ගෙන නොමැත.ගොඩනැගිලි වටිනාකම රු.118,939,421.95 ක් ලෙස මූල්‍ය වාර්තාවල පමණක් සඳහන්කර ඇත.

4. ජංගම වත්කම්

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස සඳහන් වත්කම් යන්නට මුදල් සහ බැංකු ශේෂ සහ ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරී චක්‍රය තුළ හෝ වාර්තාකරනු ලබන දින සිට වසරක් ඇතුළත යන අවස්ථා දෙකෙන් වඩා කෙටිකාලයක් තුළ උප ලබ්ධි වන් ඇතැයි අපේක්ෂිත චෙක්පත් ආදී සියල්ල ඇතුළත් වේ.

4.1 **බඩු වට්ටෝරු පොත් සහ තොග**

බඩු වට්ටෝරු පොත් සහ තොගවල වටිනාකම තත්‍ය පිරිවැයට අනුකූලව තක්සේරු කරනු ලැබේ. ප්‍රථමයෙන්ම ලැබ ප්‍රථමයෙන්ම නිකුත් කිරීමේ (First- In, First – Out) පදනම මත පිරිවැය ගණනය කරනු ලැබේ. ගිණුම් වල සඳහන් තොග ශේෂයන් තොග ගැනීමක් වශයෙන් සත්‍යාපනය කරන ලදී.

4.2 **වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ**

උපලබ්ධි විය හැකි යැයි ඇස්තමේන්තු කරනලද ප්‍රමාණයන්ගෙන් වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ මෙහි සඳහන් කර ඇත. අදාළ කාල පරිච්ඡේදය තුළ පාඨමාලා ගාස්තු වලින් ලද ආදායම හඳුනා ගනු ඇත. ඒ අනුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා , විද්‍යාපති (MSc) , දර්ශනපති (M.Phil) , ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති (MBA) සහ දර්ශන ශූරී (Ph.D) යන පශ්චාත් උපාධි පාඨමාලාවල ආදායම පිළිවෙලින් අවුරුදු 1, අවුරුදු 2, අවුරුදු 2, අවුරුදු 2 සහ අවුරුදු 3 කාලයන් තුළ ආදායම් ලැබෙන බවට හඳුනාගෙන ඇත.

විගණන හා කළමනාකරණ කමිටුව විසින් 2011.12.28 දින පවත්වන ලද 71 වන රැස්වීමේදී ලබා දුන් උපදෙස් අනුවල. උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලබා දී ඇති උපරිම කාල සීමාව දක්වා ලැබිය යුතු දේ තබා ගැනීමේ ක්‍රමවේදය උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලබා දී ඇති අවම කාල සීමාව දක්වා ලැබිය යුතු දේ පමණක් ගිණුමේ තබා ගැනීමේ තීරණය කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. අවම කාල සීමාවෙන් පසු නොගෙවූ සිසුන් ලැබිය යුතු ගිණුමෙන් ඉවත් කරනු ලැබේ. එම සිසුන් පසුව උපරිම කාල සීමාව තුළ ගෙවා ඇත්නම්ල එම ලැබීම් එම වර්ෂයේ ආදායම ලෙස සලකයි.

2020 දෙසැම්බර් 31 දිනට කාර්යය මණ්ඩලයෙන් අය විමට තිබෙන තත්‍ය ණය ශේෂය ලැබිය යුතු ණය වශයෙන් සලකනු ලැබේ.

4.3 **මුදල් හා මුදල් සමාන දෑ (Cash and cash equivalence)**

අතැති මුදල්,බැංකු තැන්පතුවල තිබෙන මුදල් , කල් පිරෙන තුරු බැංකු ගතව ඇති කෙටි කාලීන තැන්පතු පිරිවැයට ගෙන එනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේ දී මුදල් හා මුදල් හා සමාන දෑ යන්නට අතැති මුදල් , බැංකු තැන්පතු , ශුද්ධ හිඟ බැංකු අයිරා ඇතුළත් වේ.

5. **වගකීම් හා ප්‍රතිපාදන**

මූල්‍ය තත්ව ප්‍රකාශනයක ජංගම වගකීම් ලෙස දක්වා ඇති වගකීම් වන්නේ කල් පිරීමෙන් පසු ඉල්ලූ විටක ගෙවන හෝ ශේෂපත්‍රය සකස් කරනු ලබන දින සිට වර්ෂයක් ඇතුළත ඉල්ලු විටක

ගෙවිය යුතු ගෙවීම්ය. එසේම, ශේෂ පත්‍රය සකස් කරනු ලබන දිනයේ සිට වර්ෂයකට පසුව ගෙවීමට නියමිතව තිබෙන ශේෂයන් ජංගම නොවන වගකීම් යනුවෙන් හඳුන්වනු ලැබේ. ආයතනයේ මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී උපචිත සියලුම වගකීම් ඒ සඳහා සැලකිල්ලට ගනු ලැබේ.

5.1 සේවක ප්‍රතිලාභ

5.1.1 නිත්‍ය දායකත්ව සැලසුම්

යම් පුද්ගලයෙකු සේවයෙන් විශ්‍රාම ගිය පසු ඔහු වෙනුවෙන් ආයතනය විසින් වෙන්ව ක්‍රියාකර ආයතනයක්ම ගෙවනු ලබන පසු රැකියා ප්‍රතිලාභ නිශ්චිත දායකත්ව සැලසුමක් ලෙස හැඳින්වේ. මෙසේ ගෙවීම් කිරීමේ දී වැටුපෙන් ස්ථාවර අනුපාතයක් ගෙවනු මිස එය අභිබවා කිසිදු ගෙවීමක් කිරීමට නීතිමය බැඳීමක් නොමැත. සියලුම සේවා නියුක්තිකයින් ආවරණය වන පරිදි සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට ගෙවීම් සිදු කිරීමට ඇති බැඳීම් ලාභ ඉපයීමේ හෝ දරණ ලද පාඩු වල වියදමක් ලෙස ගැනේ.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් සිය සේවානියුක්තිකයින් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දළ වැටුපෙන් පිළිවෙලින් 15%ක් 3% ගෙවනු ලැබේ.

5.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු සේවා නියුක්තිකයින් විශ්‍රාම ගැනීමෙන් පසුව ඔවුනට ප්‍රතිලාභ ලබා දීම සඳහාවන නිත්‍ය දායකත්ව සැළසුම්වලට අමතරව එයට අමතරව ප්‍රතිලාභ ලබාදෙන සැලස්මකි. සියලුම සේවා නියුක්තකයින් සඳහා සේවයට ඇතුළත් වූ පළමු වසරේ සිටම විශ්‍රාම පාරිතෝෂිත ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබේ. කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව යම් සේවා නියුක්තිකයෙකු හට එකී ගෙවීම් කිරීමට හැකියාව ඇත්තේ ඔහු හෝ ඇය වසර 05 ක අඛණ්ඩ සේවා කාලයක් සපුරා ඇත්නම් පමණි.

5.2 ප්‍රතිපාදන

අතීතයේ ඉටු කරන ලද කාර්යයක ප්‍රතිපලයක් ලෙස ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ නම් මෙම ප්‍රතිපාදන යථාවත් ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය නීතිමය හා ගිවිසුම් ගත බැඳීම් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ඉදිරිපත් කොට ඇත. මෙම බැඳීම් සඳහා අදාළ ගෙවීම් කිරීමට ආර්ථික ප්‍රතිලාභ ගලා යෑමක් අවශ්‍ය වන්නේය.

පාඨමාලා හැරයාම වෙනුවෙන් ප්‍රතිපාදන

සෑම උපාධි වැඩසටහනක් සඳහමෙ අයවැය සකස්කිරීමේ දී අපේක්ෂිත පාඨමාලා ගාස්තු සහ ලියාපදිංචි ගාස්තු වලින් 10% ක ප්‍රමාණයක් අධ්‍යයන කටයුතු අතරමඟදී හැර යන සිසුන් වෙනුවෙන් වෙන්කරනු ලැබේ.
නමුත් පාඨමාලා අතරමඟදී පාඨමාලා හැර යන සිසුන් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොමැති අතරපාඨමාලා හැර යන සිසුන්ගේ තත්‍ය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල ගැළපම් කරඇත.

5.3 වෙළෙඳ හා ගෙවිය යුතු වෙනත් දෑ

ගෙවීමට අපේක්ෂිත මුදල් හා මුදල් සමාන දෑ වගකීම් වශයෙන් ගිණුම් ගත කොට ඇත.

6. වෙනත් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් මත වන ප්‍රාග්ධන වියදම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හඳුන්වා දුන් වෙනත් ප්‍රාග්ධන ක්‍රියාකාරකම්මත වන වියදම් පුනරාවර්තන වියදම් ලෙසින් වාර්තාකර ඇත.

7. අසම්භාව්‍ය වගකීම් හා වත්කම්

7.1 අසම්භාව්‍ය වගකීම්

2020.12.31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අසම්භාව්‍ය වගකීම් හඳුනා ගෙන නොතිබුණි.

7.2 අසම්භාව්‍ය වත්කම්

2020.12.31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අසම්භාව්‍ය වත්කම් හඳුනා ගෙන නොතිබුණි.

8. මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය

8.1 වර්ෂයේ අතිරික්තය ගණනය කිරීමේ දී,ආයතනයේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී හා මූලධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ දී දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩු කරන ලදී.

8.2 ආයතනයේ ඉපැයීම් ධාරිතාව ඉහළ නැංවීම පිණිස සිය කටයුතු පවත්වාගෙන යෑමේ දී වත්කම් අත්පත් කර ගැනීම, වැඩි කර ගැනීම හා වැඩි දියුණු කිරීම සඳහා දරන ලද වියදම් මූලධන වියදම් ලෙසසලකන ලදී.

9. **බදුකරණය**

2006 අංක 01 දරන දේශීය ආදායම් පනතේ 7 (ආ) (V) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කොට ඇත.

10. **රජයේ ප්‍රතිපාදන**

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන අදාළ පිරිවැය හඳුනා ගන්නා ලද කාල පරිච්ඡේදය තුළ දී ලද ආදායම ලෙස සැලකේ.

මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද , නිදහස් කරන ලද හා නිදහස් කිරීමට ඇති මූල්‍ය ප්‍රතිපාදන ශේෂ පිළිබඳ සාරාංශය පහත දැක්වේ

විස්තරය	2020 වෙන් කරන ලද මුදල (රුපියල්)	2020 නිදහස් කරන ලද ප්‍රතිපාදන (රුපියල්)	නිදහස් කිරීමට ඇති මුදල (රුපියල්)
පුනරාවර්තන ප්‍රතිපාදන	58,500,000	58,500,000	-
ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම්			
1. ගොඩනැගිලි	-	-	-
2. වාහන	-	-	-
3. උපකරණ	-	-	-
4.වෙනත්	-	-	-
			-
වත්කම් අත්පත් කර ගැනීම			
1. පොත් හා චාර සඟරා	500,000	500,000	-
2.විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ	-	-	-
3. කාර්යාලයීය උපකරණ	-	-	-
4. ගෘහ භාණ්ඩ හා සවි කිරීම්	-	-	-
5. ක්‍රීඩා භාණ්ඩ	-	-	-
එකතුව	**59,000,000**	**59,000,000**	**-**

කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන්	2020.12.31		2019.12.31	
වත්කම්		රු.	රු.	රු.	රු.
ජංගම වත්කම්					
(අ) මුදල්, මුදල් හා සමාන දෑ	01	18,566,878		32,057,246	
(ආ) වෙළඳ හා අනෙකුත් ලැබියයුතු දෑ	02	24,419,150		29,211,630	
(ඇ) තොගය	03a	1,976,039		1,247,352	
නිර්දේශිත ග්‍රන්ථ හා ප්‍රකාශන	03b	546,116		662,398	
(ඇ) පූර්ව ගෙවීම්	04	68,147		75,225	
(ඉ) ණය සහ අත්තිකාරම්	05.1	1,390,074		1,413,989	
(ඊ) කෙටි කාලීන ආයෝජන	06.1	604,473,637		515,219,597	
(උ) අනෙකුත් මූල්‍ය වත්කම්		192,800	**651,632,841**	192,800	**580,080,237**
ජංගම නොවන වත්කම්					
(අ) සේවක ණය සහ අත්තිකාරම්	05.1	3,147,443		3,068,248	
(ආ) දිගු කාලීන ආයෝජන	06.2	14,933,776		13,513,827	
(ඇ) දේපල පිරියත හා උපකරණ	07	123,451,733		125,297,320	
(ඈ) නොනිමි වැඩ	07a	2,197,146	**143,730,099**		**141,879,395**
මුළු වත්කම්			**795,362,939**		**721,959,632**
වගකීම්					
ජංගම වගකීම්					
(අ) විලම්බිත ආදායම්	08.1	14,124,568		4,069,558	
(ආ) ගෙවිය යුතු වියදම්	09	13,999,647		13,199,611	
(ඇ) උපචිත වියදම්/ වෙන්කිරීම්	10	49,471,043	**77,595,258**	45,236,123	**62,505,292**
ජංගම නොවන වගකීම්					
(අ) විලම්බිත ආදායම්	08.1	1,479,875		497,033	
(ආ) පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	11	15,807,140	**17,287,015**	14,809,631	**15,306,664**
මුළු වගකීම්			**94,882,273**		**77,811,957**
මුළු ශුද්ධ වත්කම්			**700,480,666**		**644,147,675**
ශුද්ධ වත්කම්/හිමිකම්					
සමුච්චිත අරමුදල	12	6,486,857		8,659,541	
ප්‍රත්‍යාගණනය අතිරික්තය	13a	10,345,707		64,653,139	
ඉ/ගෙ අතිරික්තය/ ඌණතාවය	13	665,724,857		558,203,290	
නිශ්චිත අරමුදල්	14	17,923,244	**700,480,666**	14,060,005	**645,575,975**
මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්			**700,480,666**		**645,575,975**

පිටු අංක ii සිට vi දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 11 සිට 23 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන හා බදුණු කොටසක් වේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමණාකරණ මණ්ඩලය වගකීමෙන් බැඳෙන මෙම මූල්‍ය ප්‍රකාශන කළමණාකරණ මණ්ඩලය විසින් අනුමත කොට ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබනු ලැබේ.

මහාචාර්ය සී. එම්. බී. දෙමටවැව
අධ්‍යක්ෂ / ගණාන්දිමේ නිලධාරී

කේ.ඒ.අයි.එස් රණසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන්	2020.12.31	2019.12.31
මෙහෙයුම් අයභාරය		රු.	රු.
රජයේ ආධාර(පුනරාවර්තන වියදම් සඳහා)		58,500,000	60,000,000
අනෙකුත් ඉපයීම්	15	114,852,139	148,965,127
රජයේ ආධාර මත ක්‍රමක්ෂය	7	2,672,684	2,636,653
ප්‍රත්‍යාගණනය අතිරික්තය මත ක්‍රමක්ෂය	13a	10,345,707	-
පර්යේෂණ අධාර මත ක්‍රමක්ෂය	F	8,965,662	11,665,998
		195,336,192	**223,267,778**
මෙහෙයුම් වියදම්			
පෞද්ගලික පඩිනඩි හා වේතන	16	78,037,775	91,720,781
ගමන් වියදම්	17	23,749	51,230
සැපයුම් හා පරිභෝජන භාණ්ඩ	18	1,578,481	2,813,287
නඩත්තුකිරීමේ වියදම්	19	1,023,460	1,161,277
කොන්ත්‍රාත් සේවාවන්	20	6,512,824	8,051,299
ක්ෂයකිරීම් හා ලියාහැරීම්	21	15,311,625	13,753,349
අනෙකුත් පුනරාවර්තන වියදම්	22	20,322,772	32,693,169
පර්යේෂණ අධාර මත වියදම්	F	8,965,662	11,665,998
මුළු මෙහෙයුම් වියදම්		**131,776,349**	**161,910,390**
කාළපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය		**63,559,843**	**61,357,388**

මහාචාර්ය සී. එම්. බී. දෙමටවැව
අධ්‍යක්ෂ / ගණන්දීමේ නිලධාරී

කේ.ඒ.අයි.එස් රණසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2020 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල	ප්‍රත්‍යාගණන සංචිතය	එකතුව
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	540,629,948	66,234,293	606,864,241
	540,629,948	**66,234,293**	**606,864,241**
වර්ෂය තුල වියදම් කල හා වියදම් නොකල මූලධන ආධාර	(2,636,653)		(2,636,653)
රජයේ මූලධන ආධාර	5,000,000		5,000,000
විශේෂ අභ්‍යන්තර අරමුදල් වල වැඩිවීම	6,831,225		6,831,225
2018 වර්ෂයේ උපචිත විදුලි ගාස්තු අධි වෙන්කිරීම් ඉවත් කිරීම	53,003		53,003
2017 වර්ෂයේ උපචිත බාහිර දේශන ගාස්තු ඉවත් කිරීම	6,785,210		6,785,210
පෙර වර්ෂයේ ලැබිය යුතු පොළි ගිණුම් වල වැඩි වීම	311,142		311,142
කපාහල පුස්ථකාල හා විද්‍යා තැන්පතු පුමාණය	(246,000)		(246,000)
රදවා ගත් මුදල් පෙර වර්ෂයේ ආදායමෙන් ගෙවීම	(502,320)		(502,320)
පාඨමාලා අත්හල අයගෙන් ලැබිය යුතු පුමානය 2008-2014	(7,462,275)		(7,462,275)
ප්‍රත්‍යාගණනය වත්කම් මත ක්‍රමැෂය	1,581,154	(1,581,154)	-
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ ඌනතාවය	61,357,388		61,357,388
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**611,701,822**	**64,653,139**	**676,354,961**
වර්ෂය තුල වියදම් කල හා වියදම් නොකල මූලධන ආධාර	(2,672,684)		(2,672,684)
රජයේ මූලධන ආධාර	500,000		500,000
විශේෂ අභ්‍යන්තර අරමුදල් වල වැඩිවීම	3,863,239		3,863,239
වර්යේ උපචිත පිරිසිදු කිරිමේ සේවා ගාස්තු හා අනිකුත් ගාස්තු අධි වෙන්කිරීම් ඉවත් කිරීම	125,587		125,587
2017 - 2018 වර්ෂයේ උපචිත බාහිර දේශන ගාස්තු ඉවත් කිරීම	10,564,723		10,564,723
පෙර වර්ෂයේ උපචිත විගණන ගාස්තු . ලේකම් ගාස්තු අධි වෙන්කිරීම් ඉවත් කිරීම	443,110		443,110
අවම කාල සීමාව තුල නොලැබුණු පාඨමාලා ගාස්තු හා ලියාපදිංචි ගාස්කු සහ වෙනත් ලැබීම් 2011-2018	(34,953,549)		(34,953,549)
අවම කාල සීමාව තුල නොලැබුණු පාඨමාලා ගාස්තු හා ලියාපදිංචි ගාස්කු සහ වෙනත් ලැබීම් 2017-2019	(6,770,800)		(6,770,800)
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම්

නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවති.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවිකිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ XI වන වගන්තිය හා 2003 ජූනි 02 දිනැති PED/02 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය	මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ අතිරික්ත මුදල් ඉල්ලුම් තැන්පතු, කෙටිකාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු හෝ වෙනත් ඕනෑම ආයෝජනයක් සිදුකළ හැකි වුවත්, එවැනි අනුමැතියකින් තොරව රු.85,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතු 02 කද රු.4,000,000 ක මුදලක් ඉල්ලුම් තැන්පතු දෙකකද ආයෝජනය කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 757	සෑම වර්ෂයකට වරක්ම භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු වුවත්, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය සඳහා 2016 වර්ෂයෙන් පසු භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පශ්චාත් උපාධි ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3. වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂිත රු.31,107,047 ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘතීන් 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු රු.11,160,670 ක්ද පාඨමාලා ගාස්තු රු.17,432,712 ක්ද වසර 03 සිට වසර 10 දක්වා කාලයක් අය නොවී හිඟව පැවතුණි.

(ඇ) ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් සමඟ රු.2,100,000 ක මුදලකට ගිවිසුම්ගත වී, අත්තිකාරම් වශයෙන් රු.1,500,000 ක මුදලක් ගෙවා තිබූ නමුත්, ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 02 කට වැඩි කාලයක් ගතවී ඇතත්, පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

(ඈ) පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් වාර්ෂිකව මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් ලබා දී තිබිය දී අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු. 628,407,413 ක ස්ථාවර තැන්පතු ශේෂයක් පැවතුණි. එබැවින් පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු අඩුකර වැඩි පිරිසකට පශ්චාත් උපාධි හැදෑරීම සඳහා අවස්ථා ලබාදීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

22.04.2021

සහකාර විගණකාධිපති,
සහකාර විගණකාධිපති කාර්යාලය,

කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර.

01	**මූල්‍ය ප්‍රකාශන**	
1.2	**මතය සඳහා පදනම**	**විගණකාධිපති වාර්තාවට පිළිතුර**
අ	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව මුදල් නොවන වෙනස්වීම අතිරික්තයට හෝ ඌනතාවයට ගැලපිය යුතු වුවත්, රු. 425,000 ක් වූ විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් මුදල් නොවන වෙනස් වීම් යටතේ දක්වා නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව මුදල් නොවන වෙනස්වීම් නොව මුදල් නොවන ගණුදෙනු වල අගය අතිරික්තයට හෝ ඌනතාවයට ගැලපිය යුතු වන්නේය. මෙහිදී මුදල් නොවන ගණුදෙනු වශයෙන් හඳුන්වන්නේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මුදල් ප්‍රවාහයන්ට මැදිහත් නොවන ගණුදෙනුය. මේ අනුව විගණන ගාස්තු සඳහා වන වෙන්කිරීම තුල මුදල් ප්‍රවාහයක් පවති මෙහිදි පෙර වර්ෂයේ පැවති රු. 840,000 ක් වූ විගණන ගාස්තු වෙන්කිරීම 2020 වර්ෂයේදී ගෙවා ඇත. එය මුදල් ප්‍රවාහයක් වන අතර එහි වෙනස උපචිත වියදම් හා වෙන්කිරීම් යටතේ වන වෙනස්වීම් අගය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් කොට ඇත. වර්ෂයේ විගණන ගාස්තු ගෙවීම ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍යයන ක්‍රියාකාරකම් යටතේ පෙන්නුම් කර ඇත.

ආ	සමාලෝචිත වර්ෂයට අදාළ ආයෝජන මත වාර්ෂික පොලී ආදායම රු.39,800,523 ක් වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේහි අනෙකුත් ඉපයීම් යටතේ ආයෝජන මත පොලී ආදායම රු.39,834,214 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ පොලී ආදායම රු.33,691 කින් වැඩිපුර දක්වා තිබුණි.	බැංකු මගින් 2018 2019 වර්ෂ වල දෙන ලද ආයෝජන පොළී මත රදවා ගැනීමේ බදු මුදලක් අයකල අතර 2019 වර්ෂයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් චක්‍රලේඛයක් මගින් 2018 මාර්තු මස 15 වැනි දිනෙන් පසු අය කරගන්නා ලද බදු මුදල් යළිත් ආයතනය වෙත ලබා ගැනීමට කටයුතු කරන ලෙස කරන ලද දැනුම්දීමට අනුව අප ආයතනය එම බද්දෙන් නිදහස් ආයතනයක් වීම මත එම වර්ෂයන්ට අදාලව අයකල බදු ප්‍රමාණය ආපසු ගෙවන ලදී එහිදි ලංකා බැංකුව විසින් තැන්පතු දෙකකට අදාලව දෙවරක් බදු මුදල් ආපසු ගෙවීම මත රු 33,691 ක මුදලක් වාර්ෂික ආදායමට වඩා ගිණුමේ පැවතුනි. මෙම මුදල සම්බන්දව අදාල බැංකුව සමග නිරවුල් කිරීමක් කෙරෙන අතර එයින් පසුව ඒ සම්බන්දව ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වන අතර එතෙක් එම ප්‍රමාණය ගිණුමේ පෙන්නුම් කර ඇත.
ඇ	සමාලෝචිත වර්ෂය අවසානයට රු.45,000 ක් වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේහි අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.	ලැබිය යුතු පාඨමාලා ගාස්තු ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ ශිෂ්‍ය තොරතුරු පද්ධතියේ පවතින තොරතුරු ගෙන එය පාඨමාලා හා අධ්‍යයන වර්ෂය අනුව වෙන් කර නැවත සකස් කිරීමෙනි. ඒ මත 2018 වර්ෂයේ M.Sc. (CW & R) වල එක් සිසුවකුගේ අවසන් සමාසිකයට අදාල පාඨමාලා ගාස්තු වන රු 45,000 ප්‍රමාණය ලැබිය යුතු ලෙස ලේඛනයේ ඇතුලත් වුවද පසුව මුදල් තැන්පත් කර ඇති නමුත් ශිෂ්‍ය තොරතුරු පද්ධතිය යාවත්කාලින නොවීම හදුනා ගැනීම නිසා අවසන් ගණනයේදී ලැබිය යුතු පාඨමාලා ගාස්තු වලට සහ ලැබිය යුතු කාල විශ්ලේෂණයට ඇතුලත් නොකරන ලදි. එමෙන්ම එම මුදල ආදායමට ගෙන ඇති හෙයින් ආදායම් ප්‍රකාශනය නිවැරදිය. 2018, 2 වැනි සමාසික සිසුන්ගේ අවම කාලය 2021 වර්ෂයේ මුල් මාසය දක්වා දිර්ඝ කිරීමක් කර ඇත.
ඈ	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 71 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට රු.10,439,327 ක් වූ පුස්තකාල තැන්පතු	පුස්තකාල තැන්පතු ඉල්ලු විටෙක ගෙවිය යුතු වන වගකීමකි. මෙහිදි ප්‍රායෝගික තත්වය වනුයේ ශිෂ්‍යයන්ට පාඨමාලාවන් හැදෑරීම සඳහා ලබාදි ඇති උපරිම හා අවම කාල පරාසය තුල ඕනෑම අවස්ථාවකදී පශ්චාත් උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම,

	ශේෂයක් ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස හඳුනාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගැලපීම් කර නොතිබුණි.	අත්හැරයාම , ඉහළ දැමීම (upgrade the degree) , පහළ දැමීම (downgrade the degree) යන ඕනෑම කාරණාවක් ඉටු කරගත හැකිවීමෙන් පුස්ථකාල තැන්පතු ඉල්ලීම කවර අවස්ථාවකදී කෙරේද යන්න නිශ්චිතව නිර්ණය කළ නොහැකි වීමයි. ඒ අනුව වසර දෙකක උපරිම කාලසීමාවක් ඇති පශ්චාත් උපාධිය {MSc (CW & R)} වසරකින් නිම කළහොත් {පාඨමාලාවේ පර්යේෂණ අධ්‍යයන (Rearch) අතහැර පාඨමාලා අධ්‍යයන (Course Work) කාර්යයන් පමණක් හැදෑරීම} පාඨමාලාව සඳහා ලියපදිංචි වී පසුව පර්යේෂණ ජංගම නොවන වගකීම, ජංගම වගකීම් ඝණයට වැටේ. මෙය ඉතා සංකීර්ණ ක්‍රියාවලියකි. ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 01 හි 71 වන ඡේදය ප්‍රකාරව ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස හඳුනාගෙන පෙන්විය යුතු බව සඳහන් වුවද 74 වන ඡේදයෙන් ද්‍රවශීලතාවය අනුව ඉදිරිපත් කිරීමේ ඉඩ ප්‍රස්තාවත් 81 වන ඡේදයේ අස්තීත්වයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය පැහැදිලිව හඳුනාගත නොහැකි විට එම කාල සීමාව මාස 12 ක් යැයි උපකල්පනය කර වගකීම වර්ගීකරණය කළ හැකි බව සඳහන්ය. ඒ අනුව ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස හඳුනාගැනීම නිවැරදිව, පැහැදිලිව කළ නොහැකි වන පුස්තකාල තැන්පතු ජංගම වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම නිවරදිය.
ඉ	වසර 05 කට වැඩි කාලයක් ඉදිරියට එමින් පවතින සානා ව්‍යාපෘතිය යටතේ ගෙවිය යුතු වියදම් වශයෙන් දක්වා ඇති රු.849,307 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	සානා ව්‍යාපෘතිය අදාල ප්‍රමාණය ගෙවිය යුතු මුදලක් ලෙස නොව නිරවුල් කලයුතු ශේෂයක් ලෙස ජංගම වගකීමක් සේ සලකා ගිණුම් තබා ඇත. සානා ව්‍යාපෘති ගිවිසුමට අනුව යෙෂුවා ටෙක් ආයතනය මඟින් බඳවා ගන්නා ලද සිසුන් විසින් ගෙවනු ලබන ලියාපදිංචි ගාස්තු සහ පාඨමාලා ගාස්තු මුළු ආදායමෙන් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය කරන සේවාව වෙනුවෙන් කරනු ලබන

		ගෙවීමක් ලෙස 2014 වර්ෂයේදී රු.1,188,706.97 ක මුදලක් ලද අතර ගිවිසුමට අනුව එම මුදලින් දේශකවරුන්ගේ ගුවන් ටිකට්පත්වලට දායකත්වය ලෙස 2015 වර්ෂයේදී රු.339,400.00 ක මුදලක් වැයකර ඇත. 2017 වර්ෂයේදී රු. 3,000.00 ක් නීති ගාස්තු ලෙස ගෙවා ඇති අතර ඉතිරිය අරමුදල් ගිණුමක පෙන්නුම් කර ඇති අතර එය විදේශ ශිෂ්‍ය පර්යේෂණ කටයුතු වෙනුවෙන් ලද ගෙවීමක් නොවේ. 2017-12-31 දිනට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ආයතනය කරන ලද වියදම් අඩුකල පසු රු. 846,306.97 ක මුදලක් අදාල ගිණුමෙහි පෙන්වයි. මෙම ව්‍යාපෘතියේ ගිවිසුම අවසන් වූ පසු ගන්නා ලබන තීරණ වලට අනුව අදාල මුදල් සම්බන්ධව ගිණුම් තැබීම ඉදිරියේදී සිදු කරනු ලබයි. 2020.12.31 දින වන විටත් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැති අතර අදාල තානාපති කාර්යාලය හරහා යොමුවා ටෙක් ආයතනය සම්බන්ධ කරගැනිමට තවමත් උත්සහ දරන්නෙමු.
2.2	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.	
අ	නීතිරීති/ විධානයට යොමුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	නිරීක්ෂණ
	i. මුදල් රෙගුලාසි 757	සෑම වර්ෂයකට වරක්ම භාණ්ඩ සමීක්ෂණ පැවැත් විය යුතු වුවත් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා විශ්වවිද්‍යාලයයේ කෘෂිකර්ම පීඨය සමඟ පවත්වාගෙන යන පුස්තකාලයේ වසරක් පාසා භාණ්ඩ සමීක්ෂණයක් සිදු නොවුවත් 2016/ 2017 වර්ෂයෙන් පසුව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

		සඳහා 2016/2017 වර්ෂයෙන් පසු භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.	මහින් භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර ඇත. 2017/ 2018 යන වසර තුල එම භාණ්ඩ සමීක්ෂණය සිදු කෙරුන අතර එහිදී සොයාගත නොහැකි පොත් 399 ක් (Number of items not traced-399) ඇති බව වාර්තා විය. එම පොත් 399 පිලිබඳ ලේඛනය එම වසරේ පැවති විගණන කමිටුවට ඉදිරිපත් කරන ලද අතර එම ලැයිස්තුවට අමතරව පුස්තකාලයේ ඇති සියලුම පොත්වල පරිග්‍රහණ අංකය, පොතේ නම, කතුවරු හා මිල ගණන්, ප්‍රකාශිත වර්ෂය ආදී සියලු තොරතුරු අවශ්‍ය බව විගණන කමිටුව පැවසූ නිසා මේ වනවිට එම තොරතුරු Excel මෘදුකාංග ආශ්‍රිතව ගොනු ගත කර ලදි. මේ හේතුවෙන් වර්තමානයේදී පුස්තකාල පොත් ලේඛනය 98% පමණ යාවත්කාලීන කර අතර ඉදිරි වසරවල දී අවශ්‍ය පරිදි භාණ්ඩ තොග සමීක්ෂණය වාර්ෂිකව සිදු කල හැකි බව ප්‍රකාශ කළ හැක. මේ වන විට අභ්‍යන්තර විගණන අංශයෙන් දන්වන ලද සංයුතියට අනුව තොග සමීක්ෂණ මණ්ඩලයක් පත් කර තොග සමීක්ෂණය ආරම්භ කර ඇති අතර එය අවසන් අදියරයේ පවතී.මෙම තොග සමීක්ෂණ මණ්ඩලය සඳහා අභ්‍යන්තර විගණන අංශයේ නිරීක්ෂකයින් දෙදෙනෙකුද ඇතුලත් කර ඇත.
	ii. මුදල් රෙගුලාසි 396(ඇ)	නිකුත් කල නමුත් මාස 06 කට වඩා වැඩි කාලයක් මුදල් නොවූ රු.42,470 ක් වටිනා චෙක්පත් 17 ක් සම්බන්දයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	රජයේ මුදල් රෙගුලාසි 396 පරිදි නිකුත් කළ දිනයට මාස 06 කට වඩා වැඩි කාලයක් මුදල් නොකල චෙක්පත් ආදායමට ගැලපිය යුතුය. අප බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී එය පිළිපදින්නෙමු. නමුත් විගණන විමසුමේ සඳහන් 2020 ජනවාරි සහ පෙබරවාරි මාස වලදී කෝවිඩ් වසංගත තත්වය මත නිකුත් කළ නමුත්

		ඉදිරිපත් නොකළ වෙක්පත් සම්බන්ධයෙන් මාස හයක නීතිය තවත් මාස දෙකකින් දීර්ඝ කර බැංකු වලින් සහනයක් ලබා දුන් බැවින් බැංකු සැසඳුම් සකස් කිරීමේදී එම මාස දෙක සලකා ඔක්තොම්බර් මස මෙම වෙක්පත් ආදායමට ගන්නා ලදී.
2.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර පශ්චාත් උපාධි ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.	
	බලතල, කර්තව්‍ය, කාර්යයන් 1971 අංක 38 දරන මුදල් පනතේ XI වන වගන්තිය හා 2003 ජූනි 02 දිනැති PED/02 රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 8.2.2 වගන්තිය	නිරීක්ෂණ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ ඇති අතිරික්ත මුදල් ඉල්ලුම් තැන්පතු, කෙටිකාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු හෝ වෙනත් ඕනෑම ආයෝජනයක් සිදුකළ හැකි වුවත්, එවැනි අනුමැතියකින් තොරව රු.85,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතු 02 ක ද රු.4,000,000 ක මුදලක් ඉල්ලුම් තැන්පතු දෙකකද ආයෝජනය කර තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන වක්‍ර ලේඛන අංක 02/2019 හා 04/2019 වක්‍ර ලේඛනයන්ට අනුව වසර අවසානයේ ආයතනයේ ජංගම ගිණුම්වල පවතින අතිරික්ත ශේෂ ඵලදායක අයුරින් ස්ථාවර තැන්පතුවල ආයෝජන කිරීම සඳහා ආයතනයේ මූල්‍ය කමිටු නිර්දේශයන් සහ කළමණාකරන කමිටුවේ අනුමැතිය ලබාගත යුතු බවත් අනතුරුව 1971 අංක 38 දරණ මුදල් මුදල් පනතේ XI වන වගන්තිය හා 2003 ජූනි 02 දිනැති PED/02 දරණ රාජ්‍ය පරිපාලන වක්‍රලේඛනයේ 8.2.2 වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකළ යුතු බවත් සඳහන්ය. ඊට අනුකූලව 2020 දෙසැම්බර් මස 12 දින පැවති 61 වැනි මූල්‍ය කමිටුවේ නිර්දේශය හා එදිනම පැවති කළමනාකරන කමිටුවේ අනුමැතිය සහිතව 2020 දෙසැම්බර් මස 30 දින කරන ලද ආයෝජනයන් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකර ඇත. මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට මාස 06 ක පමණ වන බැවින්ද , මිල ප්‍රකාශනයක වලංගු කාලය දින 03 ක් පමණ වන හෙයින්ද අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ආයෝජනය කටයුතුවල නියැලීමේදී වර්ෂ අවසාන අතිරික්තය නියමිත දිනම ආයෝජනය කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා නිසා ආයතනයේ අනුමැතින් වලට යටත්ව ආයෝජන කටයුතු කර මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමුකර කරන ලදී. (ඇමුණුම 01)

ආ	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(2)	පොදු 287 ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් ආයතනය විසින් පවත්වා ගත යුතු වුවත්, එසේ පවත්වාගෙන ගොස් නොතිබුණි.	කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කළමණාකරණ විගණන චක්‍රලේඛ අංක **DMA/2009 (2)** ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන අංශය විසින් ලබාදෙන ලද ආකෘතියට අනුකූලව ස්ථාවර වත්කම් ලේඛනයක් අප පවත්වාගෙන යන්නෙමු. විශ්වවිද්‍යාල පද්ධතිය වෙනුවෙන් ලබාදෙන ලද එම ආකෘතියද **DMA/2009(2)** චක්‍රලේඛයට සමගාමී බොහෝ කරුණු ඇතුලත් කොට ඇත.
2.4	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව		
අ	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.2,868,500 ක් වටිනා මිලදී ගැනීම් 05 කට අදාළව ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.		2020 වසරේ පැවති Covid-19 වසංගත තත්වය මත රට වසා දැමීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර ප්‍රසම්පාදනය සම්පූර්ණ කළ නොහැකි වූ භාණ්ඩ 2021 වසරේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඒ අනුව ක්‍රියාත්මක කරන බව දන්වා සිටිමි.
ආ	සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂිත රු.31,107,047 ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘතීන් 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.		විගණන විමසුමේ දක්වා ඇති ඉදිකිරීම් 2020 වසරේ ආරම්භ කර 2021 වසරේ අවසන් කිරීමට ආයතනය අපේක්ෂා කරන ලද අතර ඉහත සඳහන් කල බාධාකාරී තත්ත්වයටතේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට ආයතනයට නොහැකි විය. ඉන් නව ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය (Renovation of wash room Complex at PGIA new Building) ඉදිකිරීමට අදාල මූලික ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවීම් සිදු කර තිබූ අතර ඒ සම්බන්ධ මිල

		ගණුන් කැඳවීමේ වාර්තා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි. ඉන් අනතුරුව ඉහත සඳහන් කළ පරිදි පැන නැගුන අවහිරතා නිසා ඒ සම්බන්ධ ක්‍රියාවලිය අඛණ්ඩව කරගෙන යාමට නොහැකි වීමෙන් අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කල් ඉකුත්වන ලදි. එසේම විශාල ඉදිකිරීමේ කාර්යයන් සඳහා යොමු නොවෙන ලෙස රජය ඉල්ලා සිටි බැවින් හා විවෘත මිල ගණුන් කැඳවීම් හා එවා ඉදිරියට ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවය මත එම ඉදිකිරීමේ කාර්යය හා විගණන විමසුමේ සඳහන් අනෙකුත් ඉදිකිරීමේ කාර්යයන් වෙත එම වසරේදි ආයතනය යොමු නොවූ නමුත් ගොඩනැගිලි වල අලුත්වැඩියා කිරීම් රැසක් ආයතනින මට්ටමින් එම වසරේදී සිදු කිරීමට කටයුතු කරන ලදි. එසේ විගණන වාර්තාවේ සඳහන් කර ඇති ඉදිකිරීම් 2021 වසරේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇති අතර ඉදිරි කාර්යයන් මෙම වසර තුල ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.
ඇ	සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂිත රු.6,877,996 ක් වටිනා අයිතමයන් 13 ක ප්‍රසම්පාදන කටයුතු අවසන් කළයුතු දිනය පසුවී මාස 01 සිට 08 දක්වා කාලයක් ගතවී ඇතත්, එම මිලදී ගැනීම් කටයුතු අවසන් කර නොනිබුණි.	2020 වසරේ පැවති Covid-19 වසංගත තත්වය මත රට වසා දැමීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් සමහර කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර ක්‍රියාත්මක කරන ලද කාර්යයන් එම වසරේ අවසන් කිරීමට හැකි නොවූවේ වසංගත තත්වය හමුවේ ලෝකය පුරා සියලු සැපයුම් මාර්ග අඩපන වී තිබුන බැවිනි. එසේ ප්‍රසම්පාදනය සම්පූර්ණ කළ නොහැකි වූ භාණ්ඩ 2021 වසරේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඒ අනුව ක්‍රියාත්මක කරන බව දන්වා සිටින අතර මේ වන විට එම භාණ්ඩ වර්ග වල ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර ඇති අතර සමහර භාණ්ඩ වල ප්‍රසම්පාදන කාර්යයන් අවසන් කර ඇත.

ඈ	කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් රු.542,733,424 වටිනා ස්ථාවර තැන්පතු 37 ක් විවිධ බැංකුවල ආයෝජනය කර ඇතත්, එම ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 04/2019 ප්‍රකාර ස්ථාවර තැන්පතු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ආයතනය මඟින් 2020 වර්ෂය අවසාන වන විට ස්ථාවර තැන්පතු 39 ක් පවත්වාගෙන යනු ලබන අතර ඒවාට අදාළ මූලික විස්තර සහිත ලේඛනයක් සරප විසින් පවත්වාගෙන යනු ලබයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 04/2019 ට අනුකූලව ස්ථාවර තැන්පත් ලේඛනයක් අදාළ විෂය භාර ලිපිකරු විසින් අවසන් ගිණුම් සැකසීමේදී අවශ්‍ය තොරතුරු ඇතුළත් කිරීම පිණිස වෙනම නඩත්තු කරයි. (ඇමුණුම 02)
ඉ	සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.14,000,000 ක් වටිනා සත්දින ඇමතුම් තැන්පතු 09 ක් සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට වඩා අඩු එනම් සියයට 5 – 6.5 ත් අතර අනුපාතයක් යටතේ තැන්පතු අවසන් කිරීමකින් තොරව වසර 01 සිට 03 දක්වා කාලයක් පවත්වාගෙන ගොස් තිබුණි.	විගණිත දිනය වන විට දින 07 කින් කල්පිරෙන ස්ථාවර තැන්පතු 04 ක් අප ආයතනය සතුව පැවතිණි. ඉන් රු.2,000,000.00 බැගින් වූ තැන්පතු දෙකක් මහජන බැංකුවේද, රු.2,000,000.00 සහ රු.3,000,000.00 ක් බැගින් වූ තැන්පතු දෙකක් ලංකා බැංකුවේද වශයෙනි. ඒ අනුව මුළු තැන්පතු වටිනාකම රු.9,000,000.00 ක් ලෙස නිවැරදි විය යුතුය. 2020.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂයේදී මහජන බැංකුවේ තැන්පතු කොට තිබූ රු.4,000,000.00 ක දින 07 ක කල්පිරෙන සහතික උපලබ්ධි කොට ස්ථාවර තැන්පතු ආයෝජනයක යොදවන ලදි. ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් පර්යේෂණ අරමුදල් සඳහා වන අතර එහි පැවති මුදල් 2020 වර්ෂයේදී අපේක්ෂිත අයුරින් පර්යේෂණ සඳහා භාවිතා කළ නොහැකි වීමෙන් පැන නැගි අතිරික්ත මුදල කෙටිකාලීන ස්ථාවර තැන්පතුවක යොදවන ලද අතර හදිසි මුදල් අවශ්‍යතාවයන් පිරිමැසිම සඳහා මෙම පවතින කෙටිකාලීන දින 07 ක ස්ථාවර තැන්පතු සහතික පත් 02 ක් තවදුරටත් රඳවා ගන්නා ලදි. විගණන විමසුමේ සඳහන් කර ඇති 057600100020931-0 සහ 057600100020930-1 යන දින 07 කින් කල්පිරීමේ පදනම මත ලබාගත් තැන්පතු සහතික 2020.01.08 වැනි දින උපලබ්ධි කොට ප්‍රාග්ධන වියදම් පියවීම සඳහා යොදාගන්නා ලදි.
ඊ	ආයතනය සතු ධාවන තත්ත්වයේ පවතින අංක CPMB 3381 දරන වාහනය ගාල්කර තිබියදී 2019 වර්ෂය තුළ දින 29 ක් සඳහා රු.309,810 ක්ද 2020 වර්ෂය	සති අන්ත දිනයන් හි ආයතනයේ කොළඹ ශාඛාවේ ඉගැන්වීම් කටයුතු කරන අධ්‍යාන මණ්ඩල දේශකවරුන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා මෙම කුලී පදනම මත ලබා ගන්නා ලද වාහන යොදා ගන්නා ලද්දේ අඩුම පිරිවැයකින් එම කාර්යය කර

	තුළ දින 05 ක් සඳහා රු.53,070 ක් වශයෙන් එකතුව රු.362,880 ක මුදලක් කුලී පදනම මත වාහන ලබා ගැනීම වෙනුවෙන් බාහිර ආයතනයකට ගෙවා තිබුණි.	ගත හැකි සුදුසුම ක්‍රමය එය වූ බැවිනි. මෙම වාහන සඳහා පිරිවැය දරන්නේ අදාල අධ්‍යන මණ්ඩලය මඟින් වන අතර 20% ප්‍රමාණයක් ආයතනය සඳහා අදාල වන අදායමෙන් ගෙවනු ලබයි.එසේම දැනට පවතින ක්‍රමවේදය අනුව ප්‍රවාහන ගාස්තුවේ සිදුවන වෙනස්කම් ආයතනයේ මුල්‍ය තත්වයට බල නොපාන අතර එය දේශන සඳහා පැයකට ගෙවනු ලබන මුදල තීරණය කිරීම සඳහා පමණක් බලපෑමක් ඇති කරයි. එසේම අධ්‍යක්ෂකතුමා වෙනුවෙන් වෙන් කරන ලද වාහනයට අමතරව ආයතනය සතු වාහන 02 ක් පැවතිය ද කොළඹ වැනි දුර ගමනක් සඳහා යොදා ගත හැක්කේ ආයතනය සතු වායු සමීකරණ පහසුකම් සහිත වැන් රථය (CP -NB -3381) වන අතර තනි පුද්ගලයකු සඳහා එය භාවිතා කිරීම ප්‍රයෝගික නොවන්නා සේම වැඩි පිරිවැයක් දැරිය යුතු බව පැහැදිලි කරුණකි. මෙම කාර්යය සඳහා වාහනයක් යොදා ගැනීමේ දී 1 Km සඳහා රු.35.00 ක පිරිවැයක් දැරීමට සිදුවන අතර ආයතනයේ හා කුලී වාහන යොදා ගැනීමේ දී දැරීමට සිදුවන මිල ගණන් අතර විස්තරයක් පහතින් දක්වා ඇත. **ආයතනයේ වාහනය යොදාගැනීමේ පිරිවැය (1km සඳහා රු.35.00 බැගින්) පාලක මණ්ඩලය අනුමත අනුපාත (rate)** දළ වශයෙන් ගමනාන්තය සඳහා ඇති දුර 300 k 1 km වැය වන පිරිවැය රු. 35.0 ගමන සඳහා වැය වන මුළු පිරිවැය (300km x 35.00) රු. 10,500.0 රියදුරු සඳහා ගෙවීමට සිදුවන අතිකාල දීමනා (පැයකට රුපියල් 200.00 බැගින් පැය 20 කට) රු. 4,000.0 රියදුරු සඳහා යැපුම් වියදම් (දිනකට) රු. 400.0 **දැරීමට සිදුවන මුළු පිරිවැය** රු. 14,900.0 **කුලී පදනම් මත ලබා ගන්නා ලද වාහන යොදාගැනීමේ දී දැරීමට සිදුවන පිරිවැය (ඉන්ධන ද ඇතුළුව 1km සඳහා පැයට රු.35.00 බැගින්)** දළ වශයෙන් ගමනාන්තය සඳහා ඇති දුර km 300 1 km වැය වන පිරිවැය රු. 35.0

		ගමන සඳහා වැය වන මුළු පිරිවැය (300km x 35.00) රු. 10,500.00 **දැරීමට සිදුවන මුළු පිරිවැය** රු. 10,500.00 තවද දිගින් දිගටම මෙම කාර්යය සඳහා වාහනය භාවිතා කිරීමෙන් අමතර කොටස් ක්ෂය වීම හෙතුවෙන් නඩත්තු වියදම ද විශාල වශයෙන් දැරීමට සිදුවන බව පැහැදිලි කරුණකි. කුලී පදනම මත ලබා ගන්නා වාහන නඩත්තු කටයුතු ඉතා අඩු මුදලකින් සිදු කරගන්නා නමුදු අප ආයතනයේ වාහන දීර්ඝකාලීන පැවැත්ම සලකා නියෝජිත ආයතන වෙත යොමු කරනු ලබන බැවින් ඒ සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවේ. මේ අනුව ඉහත කාර්යය සඳහා ආයතනය අඩුම පිරිවැයක් දැරීමට සිදුවන හොඳම විකල්පයට වෙත යොමුව ඇති බව පැහැදිලි කරණකි.
උ	සමාලෝචිත වර්ෂය අවසානය වන විට ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු රු.11,160,670 ක්ද පාඨමාලා ගාස්තු රු.17,432,712 ක්ද වසර 03 සිට 10 දක්වා කාලයක් අය නොවී හිඟව පැවතුණි.	විගණන විමසුමේ සඳහන් හිඟ පාඨමාලා ගාස්තු, පාඨමාලා කාල සීමාවට ගෙවා අවසන් නොකළ සිසුන්ගෙන් අයවිය යුතු පාඨමාලා ගාස්තුය. සෑම වසරකම උපරිම කාල සීමාව අවසන් කල යම් සිසුන් ප්‍රතිශතයක් පාඨමාලා හැර යන බැවින් ඔවුන්ගෙන් අයවිය යුතු ප්‍රමාණ හිඟ පාඨමාලා ගාස්තු ලෙස පෙන්නුම් කලද උපාධි සම්පූර්ණ කල කිසිදු සිසුවකුගේ හිඟ පාඨමාලා ගාස්තු පැවතීමට කිසිදු ඉඩක් නොමැති අතර ඒ සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමවේද තදින්ම ක්‍රියාත්මක වේ. හිඟ පාඨමාලා ගාස්තු ප්‍රමාණ තීරණය කිරීමේ ක්‍රමවේදය මේ වන විට වෙනස් වී ඇති අතර ඒ අනුව මෙම ප්‍රමාණ වෙනස් විය යුතුය. එසේම හිඟ පාඨමාලා ගාස්තු ඇති සක්‍රිය සිසුන් වෙත ආයතනය ප්‍රතිඵල සටහන් ලේඛන, සහතික පත්‍ර ආදී ශිෂ්‍යන්ට ඉදිරි කාර්යයන් සඳහා අවශ්‍ය වන ලේඛන නිකුත් කිරීම සිදු නොකරයි. එසේම එම සිසුන්ට ආයතනයේ කළමණාකරන තොරතුරු පද්ධතිය හරහා අදාළ විෂයන් සඳහා ලියාපදිංචි වීමේ (Enroll) අවස්ථාව අහිමි වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් එම විෂයන්හි විභාග වලට පෙනී සිටියද ඔවුන්ට ප්‍රතිඵල

		දැන ගැනීමට නොහැකිය. හිඟ පාඨමාලා ගාස්තු ඇති කිසිදු සිසුවෙකුට පාඨමාලා ගාස්තු ගෙවන තෙක් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර ලබා නොදෙන අතර මේ නිසා හිඟ පාඨමාලා ගාස්තු ගෙවීමට ඇති කිසිදු සිසුවෙකුට උපාධි ප්‍රධානෝත්සවයට සහභාගී වීමට අවස්ථාව නොලැබේ. මෙමඟින් සිසුන් හිඟ පාඨමාලා ගාස්තු ගෙවීමට පෙළඹවීමක් සිදු වන අතර එම සිසුන් හිඟ පාඨමාලා ගාස්තු ගෙවීම මඟින් පාඨමාලාව සඳහා නැවත අනුගත කරගැනීම සඳහා විවිධ සංනිවේදන ක්‍රම භාවිතා කරමින් දැනුවත් කිරීමේ කාර්යයන්ද ආයතනය විසින් නිරන්තරයෙන් සිදු කරනු ලබයි. මීට අමතරව පාඨමාලා හැර යන සිසුන් නැවතත් පාඨමාලාව සඳහා අනුගත කර ගැනීම සඳහා ශිෂ්‍ය හිතකාමී (student friendly credit transfer) ක්‍රමය සනාථන සභා අනුමැතිය ඇතිව හඳුන්වා දී ඇති අතර එම ක්‍රමය යටතේ සිසුන් සැලකිය යුතු පිරිසක් නැවත පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇත. මෙවැනි ක්‍රියාමාර්ග ගැනීම තුලින් හිඟ පාඨමාලා ගාස්තු නැවත ආයතනය වෙත ලබා ගැනීමට ක්‍රියා කර ඇති අතර එම නිසා උපාධි ලබා ගන්නා සිසුන් සංඛ්‍යාව ඉහල යාම නිරන්තරයෙන් සිදුවී ඇත.
ඌ	මිල ගණන් කුඳවීමකින් හා කිසිදු ගිවිසුමකට එලඹීමකින් තොරව පශ්චාත් උපාධි ආයතනය සතු වර්ග අඩි 470 කින් යුතු ආපනශාලාව වසර 10 කට අධික කාලයක් එකම පුද්ගලයෙකු වෙත ලබා දී තිබුණි.	ආයතනයේ ආපනශාලාව මේ දක්වා සුභසාධක සංගමය භාරයේ තිබුනු අතර වඩා හොඳ සේවා සැපයුම්කරුවෙකු වෙත එහි කටයුතු පවරන ලද්දේ එම සංගමය මඟිනි.අවස්ථා කිහිපයකදී ඒ සඳහා කිහිපදෙනෙකුගේ සේවා ලබා ගත් අතර ඉන් දැනට එය පවත්වාගෙන යන තැනැත්තා ආයතනයට ගැලපෙන පරිදි වඩා හොඳ සේවයක් සැපයූ බැවින් 2009 සිට මේ දක්වා එහි කටයුතු පවත්වාගෙන යාමට ඔහු වෙත පවරා තිබුණේ සුභසාධක සංගමයේ අධීක්ෂණය යටතේය. කෙසේ වෙතත් 2021 ආරම්භයේදී ආපනශාලාව සඳහා විවෘත වෙළඳපලේ මිල ගණන් කැඳවීම සඳහා වන මූලික ප්‍රසම්පාදන කටයුතු සිදු කරන අතර මේ වන විට ඒ සඳහා මිල ගනන් කැඳවා ඇත.

එ	ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් Science IT (Pvt) Ltd ආයතනය සමඟ රු.2,100,000 ක මුදලකට ගිවිසුම්ගත වී අත්තිකාරම් වශයෙන් රු.1,500,000 ක මුදලක් ගෙවා තිබූ නමුත් ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 02 කට වැඩි කාලයක් ගතවී ඇතත්, පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.	මෙම පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපනය කර අවසන් කිරීමට පරිගණක මෘදුකාංග පද්ධති ශිල්පීන් හා ගිණුම් අංශයේ සේවක මණ්ඩලය (අදාල මෘදුකාංගය පරිහරණය කරන කාර්යමණ්ඩලය) යන කොටස් දෙකේම සහයෝගය අවශ්‍ය විය. මෘදුකාංගය ස්ථාපනය කර මෘදුකාංග වලින් තමන්ගේ කාර්යය පහසුවෙන් කල හැකි බවට තහවුරු කිරීමක් පරිහරණය කරන කාර්යමණ්ඩලයෙන් අවශ්‍ය වේ.නමුත් 2017 හා 2019 යන වසර දෙකේදී අනධ්‍යන කාර්යමණ්ඩලවල පැවති වැඩ වර්ජනය හා පාස්කු ප්‍රහාරය මත විශ්වවිද්‍යාලය වසා දැමීම හේතුවෙන් පරිගණක මෘදුකාංග පද්ධතිය යෝග්‍ය ලෙස ස්ථාපනය කිරීම කල් යන ලදී.මේ වන විට එහි කටයුතු අවසන් මට්ටමේ ඇති අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එය අවසන් කරන බවට සමාගම්කරු සමඟ වන ගිවිසුම යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති අතර එම ගිවිසුමේ නිත්‍යානූ කූල භාවය සහතික කර ගැනීම සඳහා එය විශ්වවිද්‍යාලයේ නීති නිලධාරී (Legal Officer) වෙත යොමු කර ඇත. ඒ සඳහා නීති නිලධාරී (Legal Officer) අනුමැතිය ලැබුන පසු එම ගිවිසුමේ පිටපතක් රජයේ විගනන අංශය වෙත ලබා දීමට පියවර ගනු ලැබේ.
ඒ	පශ්චාත් උපාධි සම්පූර්ණ කරන ලද සිසුන් විසින් පර්යේෂණ කෘතීන් 125 ක් ආයතනය වෙත භාර දී තිබුණි. එකී කෘතීන් ජාතික හෝ ජාත්‍යන්තර පිළිගත් ප්‍රකාශන මඟින් ප්‍රසිද්ධ කිරීමට හෝ ඉන් තොරාගත් කෘතීන් වාණිජකරණය කිරීමට හෝ නවෝත්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ආයතනයේ හෝ රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ආයතනය මඟින් වාර්ෂිකව පවත්වන කොන්ග්‍රස් සමුළුවට සිය පර්යේෂණ කෘති ඉදිරිපත් කරන ලෙස අභ්‍යන්තර සිසුන් හා බාහිර පාර්ශව වෙතින් ආයතනය ඉල්ලා සිටින අතර එම සමුළුවේදී සමාලෝචන මණ්ඩලයක් මඟින් තෝරා ගැනෙන කෘති Tropical Agriculture Reach journal වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කෙරෙන අතරම පොතක් ලෙස ද මුද්‍රණය කෙරේ. එම වාර්ෂික සමුළුවේ සියලු පර්යේෂණ කෘති ප්‍රධාන පෙලේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ලබාදෙන අතර සිසුන්ගේ විද්‍යුත් තැපෑල හරහා ඔවුන් සමඟ සම්බන්ධ වීමේ අවස්ථාව ලැබේ.එසේම ද්වි වාර්ෂිකව නිකුත්

		කරන PGIA News Letter මඟින්ද සිසුන්ගේ පර්යේෂණ පිළිබඳ තොරතුරු සියලු අදාළ ආයතන වලට යොමු කිරීමට කටයුතු කෙරේ. මෙයට අමතරව මෙම කෘති උසස් ප්‍රමිතිකරණයක් යටතේ වර්ගීකරණය කර ජත්‍යන්තරව ප්‍රකාශයට පත් කෙරෙනු පිණිස ඒ සම්බන්ධව විශ්වවිද්‍යාලයට අයත් ආයතනයක් වන Business Linkage, innovation incubation and technology Transfer Office (BLII-TTO) ආයතනයේ මාර්ගෝපදේශ ලබා ගැනීමට අපෙක්ෂා කෙරේ. මේ සම්බන්දයෙන් අප ආයතනයේ සියලුම කාර්යමණ්ඩලය තව දුරටත් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීමට 2021.03.06 දින කටයුතු කරන ලදී. මීට අමතරව සිසුන්ගේ නව නිපැයුම් National Invention Commission වෙත යොමු කිරීමට කටයුතු කර ඇති අතර මේ වන විට එවැනි නව නිපැයුම් 4ක් එම ආයතනයට යොමු කර ඇත.
ඒ	පශ්චාත් උපාධි ආයතනයේ 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ ස්ථාවර තැන්පතු සැසඳීමේදී 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.343,204,567 ක ස්ථාවර තැන්පතු මුදල 2020 දෙසැම්බර් 31 දින වන විට රු.628,407,413 ක් වී තිබුණු අතර එය 2016 වර්ෂයකට සාපේක්ෂව සියයට 83 ක වර්ධනයක් විය.	2016 වර්ෂයට සාපේකෂව 2020 වසර වන විට ස්ථාවර තැන්පතුවල 83% වර්ධන අනුපාතියක් පෙන්නුම් කරයි. මෙසේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනුයේ පාඨමාලා ගාස්තු, විභාග ගාස්තු, ලියාපදිංචි ගාස්තු, සමාසික ගාස්තු වශයෙන් ආයතනයේ රැස්කිරීමේ ගිණුමට බැරවන එහෙත් විලම්භනය වන දේශන ගාස්තු, විභාග ගාස්තු, පර්යේෂන වියදම් යනාදි වූ වියදම් දැරීමට වසර 2 සිට වසර 7 ක කාලයක් ගතවන ලැබීය. මෙහිදි චක්‍රයක් සේ වසරකට දෙවරක් හෝ තෙවරක් සිදුවන එකවර මුදල් ලැබීම් හා වසර පුරා වන අනෙකුත් ලැබීම් එම වසරේ පැන නගින වියදම් සඳහා ප්‍රමාණවත් බැවින් ස්ථාවර තැන්පතු උපලබ්ධි කිරීමක් සිදු නොකරන නමුත් එම වසරක ලැබීම් සියල්ල සිදුනොවුනහොත් එම වසරේ පැන නගින පාඨමාලා

		වියදම පියවීමට ස්ථාවර තැන්පතු උපලබ්ධි කිරීමට සිදුවන වක්‍රයක් මෙන් වූ සබඳතාවයක් මෙහි පවති.
ඔ	සමාලෝචිත වර්ෂය තුළ රු.500,000 ක ප්‍රාග්ධන ප්‍රදානයක් ලැබී තිබුණ අතර රු.85,000,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. ආයතනය සතුව ප්‍රාග්ධන වියදම් දැරීමේ ඉහළ මූල්‍ය ශාක්‍යතාවයක් තිබියදී ප්‍රාග්ධන ප්‍රදාන ලබාගෙන තිබූ අතර එකී මූල්‍ය සම්පත් ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා යෙදවිය හැකිව තිබියදී ප්‍රාග්ධන ප්‍රදාන මෙන් සියයට 70 ක ප්‍රතිශතයක් ආදායම් ඉපයී මේ පරමාර්ථයෙන් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.	කෘෂිකර්මවිද්‍යා පශ්චත් උපාධි ආයතනයට පුනරාවර්තන වියදම කාණ්ඩය යටතේ වැටුප් හා වේතන සඳහා පමණක් මුදල් ප්‍රතිපාදන ලබාදෙන අතර ප්‍රාග්ධන වියදම් සඳහා සුළු ප්‍රතිපාදනයක් ලබා දෙයි. පාඨමාලාවන්ට අදාල මුළු ලැබීම් වලින් 20% ක් පමණ වන ආදායමක් ද ස්ථාවර තැන්පතු පොළී ආදායමද ප්‍රධාන කොටගත් අනෙකුත් ප්‍රමාණාත්මක නොවන ලැබීම් සියල්ලම අනිකුත් සියළුම පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් දැරීමට භාවිතා කළයුතු වන්නේය. ස්ථාවර තැන්පතුවල පවතින්නේ පේරාදෙණිය හා කොළඹ ශාඛාවල ශිෂ්‍යයින් විසින් ගෙවනු ලබන පාඨමාලා ගාස්තු හා අනිකුත් ගාස්තු වේ. මෙම රැස්කිරීමේ ගිණුමේ පවතින මුදල සඳහා වන වියදම වසර 2 - 7 දක්වා වූ කාලයක් විලම්භනය වේ. මෙම පියවීම් අවශ්‍ය වන තෙක් ඵලදායී අයුරින් අතිරික්ත මුදල ආයෝජනය කිරීමක් මෙහිදි කර ඇත. ප්‍රාග්ධන ප්‍රතිපාදන කිසිම විටෙක ස්ථාවර තැන්පතු සඳහා යොමු නොකරන අතර එම අයිතම දෙක අතර සම්බන්ධතාවයක්ද නැත. 2020 වර්ෂයේදි මිලියන 14 ක් පමණ වන ප්‍රාග්ධන වියදම් සඳහා මිලියන 13.5 කම දායකත්වය ආයතනයේ මෙම ඉපයීම් වලින් ලබා දි ඇත.
ඕ	ආයතනය සතුව ඉහළ මූල්‍ය ශාක්‍යතාවයක් පවතින බැවින් වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට උපාධි ප්‍රදානය කළ හැකි අයුරින් පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු සංශෝධනය කර අය කිරීමට කටයුතු කළයුතු බව නිරීක්ෂණය කෙරේ.	ආයතනය සතුව ඉහළ මූල්‍ය ශක්‍යතාවයක් පවතින නමුත් එම ලැබෙන පොළි ආදායම සහ පාඨමාලා ලැබීම් වලින් 20% ක් වූ ආදායම පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා දැරීමට ආයතනයට සිදුවේ. ස්ථාවර තැන්පතු වලින් ආයතනයට සත්‍ය වශයෙන්ම හිමි තැන්පතු සඳහා ද කළ යුතු ප්‍රාග්ධන වියදම් රැසක් හඳුනාගෙන තිබේ. ඉතිරි ස්ථාවර තැන්පතු අධ්‍යයන මණ්ඩල 11 යටතේ පවතින සියළුම පාඨමාලාවල

	සමාලෝචිත වර්ෂය අවසානය වන විට ආයතනය සතු ස්ථාවර තැන්පතු වටිනාකම රු.628,407,413 ක් විය.	නොගෙවන ලද දේශන ගාස්තු හා අනෙකුත් අධ්‍යයන වියදම් සඳහා වන මුදලයි. එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 04/2016 ට අනුව එක් එක් උපාධි පාඨමාලාව සඳහා වෙන වෙනම ආදායම් පුරෝකථන සකස් කළ යුතු වන අතර එය ආදායම හා වියදම තුලනය වන පුරොකථනයකි (zero based budgeting) මෙහිදි ආයතනයට ලැබෙන ප්‍රතිශතයෙන් අරමුදල් සම්පාදනය කිරීමේ අපේක්ෂාවෙන් පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තුව අඩුකර ආදායම අඩුකළ නොහැකිය. වර්තමානයේ වුවද අප ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පවතින ගාස්තුව අවම මට්ටමක පවතී.
ඔ	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබූ රු.354,201 අරමුදලින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වියදමක් දරා නොතිබුණි.	වගා කර්මාන්ත අමාත්‍යාංශය මගින් කෘෂිකර්ම විද්‍යා, පීඨයට හා කෘෂිකර්ම විද්‍යා, පශ්චාත් උපාධි ආයතනයට වාර්ෂිකව මුදලක් ප්‍රදානය කරයි. නමුත් 2020 වර්ෂයේදී අප ආයතනයට මුදල් ප්‍රදානයන් නොලැබුණු අතර කොවිඩ්-19 රෝග ව්‍යාප්තිය හමුවේ සරසවි වසා දැමීම නිසාත් සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේද වලට පටහැනිව පර්යේෂණ කටයුතුවල නියැලීම, දේශන පැවැත්වීම වැනි කටයුතු වල නිරතවීම කළ නොහැකි වූ නිසාත් අරමුදල භාවිතා කිරීමට සිදුනොවීය. නමුත් 2019 වසරේද කේෂත්‍ර චාරිකා සඳහා මෙම අරමුදලින් ප්‍රතිපාදන සපයන ලදි.
ඛ	පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා පර්යේෂණ ප්‍රදාන වශයෙන් ලබා දී ඇති අරමුදල් අදාළ කාර්යයන් සඳහා ප්‍රශස්ත අන්දමින් උපයෝජනය නොකිරීම හේතුවෙන් රු.17,623,244 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි.	පර්යේෂණ කටයුතු සිදුකිරිම සඳහා පර්යේෂණ ප්‍රදාන වශයෙන් ලබාදී ඇති අරමුදල් ප්‍රශස්ත මට්ටමින්ම උපයෝජනය කිරිමට පර්යේෂණ සම්බන්ධීකාරකයින් කටයුතු කරති. 2020 ගිණුම් වර්ෂයේ දී අපේක්ෂිත පර්යේෂණ කාර්යයන් සැලසුම් කළ අයුරින් ඉටුකර ගැනීමට නොහැකි වුවේ කොවිඩ්-19 වසංගතය නිසාවෙනි. නමුත් එවන් බාධාකාරී වතාවරණයක් තුල වුවද 2020 වර්ෂයේ මුළු පර්යේෂණ ලැබීම් රු. 12,828,901.55 ක් හා වියදම් රු. 8,965,662.47 ක් ලෙසින් වාර්තා කළෙමු. එහෙයින්

		මෙම පර්යේෂණ ප්‍රදාන අදාල පර්යේෂණ කටයුතු සඳහා වියදම් නොකර අරමුදල් වශයෙන් ආයතනය තුල පවත්වාගෙන යන බව දැක්වීම නිවැරදි නොවේ.
ඟ	සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ආදායම්/වියදම් සහ සත්‍ය ආදායම්/වියදම් සිළිබඳ පරීක්ෂාවේදී අයිතමයන් 16 ක සියයට 94 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.	වර්ෂයේ මුල පෙර වර්ෂවල වියදම හා ආදායමද සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු කලද කොවිඩ්-19 වසංගතය නිසා ආයතනය වසා තැබීම මත හා කොවිඩ්-19 වසංගතය මත 2020 වර්ෂය පුරාවට රටතුල පැවැති වාතාවරණය නිසා අප ආයතනයේ අධ්‍යයන කටයුතු මෙන්ම කාර්යාලයීය කටයුතු අඩාල වූ අතර එය මත වර්ෂය තුල තථ්‍ය වියදම් / ආදායම් හා ඇස්තමේන්තු වියදම් / ආදායම් ප්‍රමාණය අතර විචලතාවයක් ඇති වුණි. **සේවක ණය පොළී** - මෙහි විචලතාවය සියයට 83 නොව සියයට 10 කී වර්ෂයේ මුල පෙර වර්ෂවල ආදායමද සැලකිල්ලට ගෙන නිලධාරීන්ගේ ණය ලබාගැනීමත් සලකා ඇස්තමේන්තු කලද Covid-19 වසංගතය නිසා ආයතනය වසා තැබීම මත ණය ගැණීම අඩුවීමෙන් පොළී ආදායම අඩු විණි. **දේපළ මත කුළී ආදායම්** - Covid-19 වසංගතය මත 2020 වර්ෂය පුරාවට රටතුල පැවැති වාතාවරණය නිසා බාහිර පුද්ගලයින් සඳහා දේපල භාවිතයට දීම හා ගැනීම අඩු වීම නිසා දේපළ මත කුළී ආදායම් ප්‍රමාණය අඩුවිණි. **පුස්ථකාල දායකත්වය** - 2020 වර්ෂයේ ලියාපදිංචි සිසුන් ප්‍රමාණය වැඩි වූ බැවින් ඔවුන් විසින් ගෙවන ලද පුස්ථකාල දායකත්වය ආදායම වැඩි විණි.

		විවිධ ලැබීම් - මෙම ආදායම වැඩි වීමට ප්‍රධාන දායකත්වයක් වනනේ Covid-19 වසංගතය මත 2020 වර්ෂය පුරාවට රටතුල පැවැති වාතාවරණය මත නිකුත් කරන ලද වෙක්පත් කාලය ඉකුත් වීම මත අවලංගු වී ඇති අතර එම වෙක්පත් වල වටිනාකම විවිධ ලැබීම් ගිණුමට ගෙන තිබීම නිසා මෙම විචලතාවය ඇති විය. **පාඨමාලා ගාස්තු** - 2020 වර්ෂයේ ලියාපදිංචි සිසුන් ප්‍රමාණය වැඩි වූ බැවින් ඔවුන් විසින් ගෙවන ලද පාඨමාලා ගාස්තු ආදායම වැඩි විණි. **විභාග ගාස්තු** - 2020 වර්ෂයේ ලියාපදිංචි සිසුන් ප්‍රමාණය වැඩි වූ බැවින් ඔවුන් විසින් ගෙවන ලද පාඨමාලා ගාස්තු ආදායම වැඩි විණි. **බාහිර ආයතනවලට සපයනලද සේවා** - මෙහි ප්‍රධාන ආදායමක් වන ආයතනයේ වාහන බාහිර ආයතනවලට හා පුද්ගලයන්නට සැපයීම හරහා ලද මුදල් ය. ආයතනයේ පර්යේෂණ ආධාර අරමුදල : (RFF) යටතේ අධ්‍යයනය කටයුතු කරන සිසුන් විසින් ලබාගන්නා ලද සේවාවන් වෙනුවෙන් එකවර ගෙවීම් කිරීම හේතුවෙන් මෙම ආදායම වැඩි විණි. **වැඩමුළුවලින් ආයතනයේ දායකත්වය**- Covid-19 වසංගතය නිසා 2020 වර්ෂය පුරාවට රටතුල පැවැති වාතාවරණය මත වැඩමුලු සහ සම්මන්ත්‍රණ සංවිධානය අඩු වීම හා අත්හිටු වීම මත වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මගින් ආයතනවට ලැබෙන ආදායම් ප්‍රමාණය අඩුවිණි.

කොළඹ ශාඛාවේ ආදායම - 2020 වර්ෂය සඳහා කොළඹ ශාඛාව වෙනුවෙන් සිසුන් ලියාපදිංචි කිරීමක් සිදු නොවූ බැවින් පෙර වර්ෂවල ලියාපදිංචි සිසුන්ගෙන් ලැබුණු ආදායම පමණක් ඔබ ඇත එබැවින් කොළඹ ශාඛාවේ ආදායම් අඩු වී ඇත.

බාහිර කථිකාචාර්ය ගාස්තු - Covid-19 වසංගතය නිසා 2020 වර්ෂය පුරාවට රටතුළ පැවති වාතාවරණය මත වර්ෂයට අදාල සමාසික පරීක්ෂණ අධ්‍යයන කටයුතු නිසිපරිදි ක්‍රමාංකූලව සිදු නොවීම මත බාහිර කථිකාචාර්ය ගාස්තු ගෙවීම් අඩු විය.

පාරිභෝගික දීමනා - පාරිභෝගික දීමනා ඇස්තමේන්තුගත කරනුයේ වසර 05ක පමණ කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයින් සැලකිල්ලට ගනිමින් හා පෙර වර්ෂයේ වියදම් සැලකිල්ලට ගනිමිනි. ඒ අනුව ඇස්තමේන්තු සකස් කළ නමුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව පවතින වටිනම අනුපාතිකයට අනුගතව කරන ගණනයේදී ලබාදුන් අගය අඩුවීම මත මෙම වියදම් අඩුවිණි.

ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා - Covid-19 වසංගතය මත 2020 වර්ෂය පුරාවට රටතුල පැවැති වාතාවරණය නිසා කාර්යාල කටයුතු අඩාල වූ අතර ඒ නිසා වර්ෂය තුල වීලදී ගැනීම් වෙනක් සිදුකල යුතු වූවත් එක් වීලදී ගැනීමක් පමනක් සිදු වීම මත ආයතනය විසින් ඇස්තමේන්තු ගත මුදලට වඩා අඩු මුදලක් වියදම් වී ඇත.

යන්ත්‍ර සූත්‍ර නඩත්තුව - Covid-19 වසංගතය මත රටතුල පැවැති වාතාවරණය නිසා අප ආයතනයේ අධ්‍යයන කටයුතු මෙන්ම කාර්යාල කටයුතු අඩාල වූ අතර මත වර්ෂය තුල උපකරණ නඩත්තු කටයුතු අවම වීම නිසා කථ්‍ය වියදම් අඩු වූහ.

		ගොඩනැගිලි නඩත්තුව - Covid-19 වසංගතය මත රටතුල පැවැති වාතාවරණය නිසා අප ආයතනයේ අධ්‍යයන කටයුතු මෙන්ම කාර්යාල කටයුතු අඩාල වූ අතර එය මත වර්ෂය තුල ගොඩනැගිලි නඩත්තු හා අලුත් වැඩියා කටයුතු අවම වීම නිසා තථ්‍ය වියදම අඩු වුණි. **ජල ගාස්තු** - පෙර වර්ෂවලට අදාලව ගෙවිය යුතු ප්‍රමාණය සඳහා වියදම සලකා බලමින් ඇස්තමේන්තුගත කළද එය 2020 වසර පුරා පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ආයතනය වසා තැබීම මත ජල පරිභෝජනය අඩු වීමෙන් වියදම අඩුවිය. **පහසුකම් වියදම්** - මෙය පර්යේෂණ සිසුන්ගේ පර්යේෂණ කටයුතු සඳහා කෘෂිකර්ම පීඨයෙන් භාවිතයට ගන්නා රසායනික ද්‍රව්‍ය හා විද්‍යාගාර උපකරණ වෙනුවෙන් වෙන් කල මුදලක් වේ. මෙම මුදල 2018 වර්ෂයේ සිසුන් වෙනුවෙන් වූ වෙන්කිරීමකි මෙයට අදාල මිලදි ගැනීම් සිදු නොවීම මත අධ්‍යයන මණ්ඩලවලට හිමි මුදල අප ආයතනයේම තබාගැනීමට කරන ලද ඉල්ලීම මතත් එම මුදල ඉතිරිව තිබුණද 2021 වර්ෂයේදි මිලදි ගැනීම සඳහා ගෙවීමට යොදාගනී.

අධ්‍යක්ෂ

කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය